පටුන

පිටුඅංකය


01 පරිච්ඡේදය - හැඳින්වීම **03-08**

1.1. දැක්ම
1.2. මෙහෙවර
1.3. ආයතනයේ බලවරම
1.4. අරමුණු
1.5. කළමනාකාරිත්ව ව්‍යුහය
1.6. 2016 වසරේ සංඛ්‍යා තත්වය

02 පරිච්ඡේදය – පසුබිම **09-14**

2.1. පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය හැඳින්වීම
2.2. ආයතනික පාලන ප්‍රකාශනය
2.3. පාලක මණ්ඩල සාමාජිකයින්
2.4. විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

03 පරිච්ඡේදය - අධිකාරි බලතල සමාලෝචනය සහ පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ආයතනික කාර්යභාරය **15-21**

3.1. ආයතනයේ උපදේශක සේවා
3.2. ඉලක්ක කණ්ඩායම්
3.3. සම්බන්ධීකරණය සහ අධීක්ෂණය
3.4. ව්‍යාපාර ප්‍රවර්ධනය
3.5. ජාතික/ ජාත්‍යන්තර පුහුණු සහ අධ්‍යාපන ආයතන සමගින් ඇති සම්බන්ධතා
3.6. විශේෂ සිදුවීම්
3.7. උපකාරක කාර්යමණ්ඩලය පුළුල් කිරීම

04 පරිච්ඡේදය - 2017 වර්ෂයේ ආයතනයේ සමස්ථ කාර්යසාධනය **22-39**

4.1. ආයතනයේ එක් එක් අංශයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු
4.2. පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සිදුකරන පැවරුම්/ ව්‍යාපෘති/ උපදේශක සේවා

05 පරිච්ඡේදය - 2017 වර්ෂයේ මූල්‍ය තොරතුරු **40-84**

5.1. විගණන මතය

5.2. a) මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශනය

b) මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය

c) ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

d) ශුද්ධ වත්කම් වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශනය

e) ගිණුම්කරණ සටහන්

06 පරිච්ඡේදය - සමාප්තිය **85-86**

## 1.0. හැඳින්වීම

දිවයිනේ පළාත් පාලන ආයතනයන්හි කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ඉදිරි දැක්මක් අවශ්‍ය වූ වාතාවරණයක් තුළ පළාත්පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය බිහි වන ලදී. මෙම දැක්ම යථාර්ථයක් බවට පරිවර්තනය කරගැනීම සඳහා ඒ පිලිබඳ අධ්‍යයනයක් සිදුකොට නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස 1997 වසරේදී ජනාධිපති කොමිෂන් සභාවක් පත් කරන ලදී. දිවයිනෙහි පළාත් පාලන ක්ෂේත්‍රයේ කාර්යසාධනය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන් මෙහෙවර ඉටුකිරීම සඳහා නව ආයතනයක් බිහි කිරීමේ වැදගත්කම මෙකී ජනාධිපති කොමිෂන් සභාව විසින් අවධාරණය කරන ලදී. ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම සඳහා ඔවුන්ගේ අපේක්ෂාවන් මුදුන්පත් කරදීමට කාර්යක්ෂම හා සතුටුදායක සේවයක් ජනතාවට ලබා දිය හැකි තත්ත්වයේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ඍජුවම දායකත්වය ලබා දිය හැකි ස්වයං බලතල සහිත ස්වාධීන අංශයක් වශයෙන් පළාත් පාලන ක්ෂේත්‍රය අවධානයට ගත යුතු බව මෙම ජනාධිපති කොමිෂන් සභාව විසින් සඳහන් කරන ලදී. එකී ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීමට වඩාත්ම සුදුසු ආයතනය වන්නේ පළාත් පාලන ආයතනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය බව මෙහිදී දරන ලද පොදු මතය විය. මහජනතාවට සමීප, ප්‍රජාතන්ත්‍රවාදී ආයතනයක් වශයෙන් මහජනතාව නියෝජනය කරන්නා වූ ආයතනයක් ලෙස කටයුතු කිරීමේ හැකියාව එය සතු විය. මෙම අභිප්‍රායයන් අනුව යමින් 1999 අංක 31 දරන පාර්ලිමේන්තු පනත මගින් පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය පිහිටුවීමට කටයුතු කරන ලදී. එම වසරේම ඔක්තෝබර් මාසයේදී එහි වැඩකටයුතු ආරම්භ කරන ලදී.

### 1.1. දැක්ම

"ප්‍රජාවට ඉහළ ගුණාත්මකබවකින් යුත් සේවාවක් ලබාදෙනබව සහතික කරන්නා වූ උද්යෝගිමත් සහ වගවීමෙන් යුක්ත පළාත් සහ පළාත්පාලන ආයතන පද්ධතියක්"

### 1.2. මෙහෙවර

"උද්දේශනය, පුහුණුව සහ පර්යේෂණ හරහා පළාත්සභා සහ පළාත්පාලන ආයතනවල තිරසර සංවර්ධනය හා යහපාලනය ප්‍රවර්ධනය කිරීමට මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම"

### 1.3. ආයතනයේ බල වරම

ආයතනයේ ක්‍රමෝපායික සැලසුම්වල සඳහන් කර ඇති පරිදි පහත දැක්වෙන කාර්යභාරයන් ඉටු කිරීම සඳහා වන රාජ්‍ය අංශයේ ආයතනයක් වශයෙන් පළාත් පාලනය සඳහා වන ශ්‍රී ලංකා ආයතනය ඇති කර තිබේ.

- ❖ රටේ යහපාලනය සහතික කිරීමේ අරමුණින් පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල සාමාජිකයින් , නිලධාරීන් සහ ඒවාට අනුයුක්තව සේවය කරන අනෙකුත් කාර්යමණ්ඩලය පුහුණු කිරීම සහ නිපුණතාවයන්ගෙන් පරිපූර්ණ සේවක මණ්ඩලයක් එම ආයතනවල ගොඩනැංවීම
- ❖ පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල සංවිධානික ව්‍යුහයන් සහ කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා උපදේශක සේවාවන් ලබා දීම
- ❖ පළාත් පාලන ආයතන සහ පළාත් සභා වල කළමනාකරණ පද්ධතීන් සහ ක්‍රියාවලීන් විශ්ලේෂණාත්මකව ඇගයීම සඳහා අවශ්‍ය වේදිකාවක් ලබාදීම
- ❖ කළමනාකරණ සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකවලට සහාය ලබා දීම
- ❖ පළාත් පාලනය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේදී ගරු ඇමතිතුමාට අවශ්‍ය තොරතුරු ලබා දීම
- ❖ පළාත් සභා සහ පළාත් පාලන ආයතන පිළිබඳව වන ග්‍රන්ථ සහ සඟරා ප්‍රකාශනය, තොරතුරු බෙදා හැරීම සහ සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම සඳහා දේශීය සහ විදේශීය ජාල සමග සහයෝගිතාවයෙන් කටයුතු කිරීම

**1.4.** අභිමතාර්ථ

ඉහත සඳහන් කළ මෙහෙවර පහත දැක්වෙන්නා වූ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මගපාදයි:

1. පළාත් පාලනයෙහි ආයතනික ශක්තිය නංවාලීම පිණිස, පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සමගින් එක්ව කාර්යසාධනය සඳහා අදාළවන්නා වූ වැඩසටහන් සම්පාදනය කිරීම.

2. පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල කාර්යසාධනය වර්ධනය කිරීමට පුහුණු වැඩසටහන් සම්පාදනය සහ එම වැඩසටහන් පැවැත්වීම සඳහා පළාත් කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක ශක්තිමත් කිරීම මෙන්ම එකී කාර්යයට සහභාගි වීම.

3. පළාත්පාලනයෙහි පාර්ශ්වකරුවන්ට තාක්ෂණික සහ වෙනත් තොරතුරු සපයා දෙමින් පළාත් පාලනය පිළිබඳ සම්පත් මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීම

4. අදාළ ජාතික සහ අන්තර්ජාතික ආයතන සමගින් සම්බන්ධ වෙමින් පළාත් පාලනය පිළිබඳ කේන්ද්‍රිය ආයතනයක් වශයෙන් කටයුතු කිරීම.

5. මානව සම්පත් කළමනාකරණය වර්ධනය, කළමනාකරණ පද්ධති වැඩි දියුණු කිරීම හා ආයතනික වෙනස්වීම් සඳහා පහසුකම් සැලසීම සම්බන්ධයෙන් වන විශේෂිත සහාය සේවාවන් උප ජාතික මට්ටමේ රාජ්‍ය ආයතන වෙත ලබා දීම .

6. පළාත් පාලන ආයතන සවිබල ගැන්වීම සඳහා පුහුණු, පර්යේෂණ සහ උපදේශන සේවා සැපයිමට හැකිවනු පිණිස පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි කාර්යසාධනය වර්ධනය කිරීම.

## 1.5. පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි කළමනාකාරිත්ව ව්‍යුහය




පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි කළමනාකාරිත්වය සහ ක්‍රියාකාරිත්වය පිලිබඳ සියලුම තීරණ ගනු ලබන්නේ පාලක සභාව විසිනි. නිශ්චිත අමාත්‍යාංශ කිහිපයක ලේකම්වරුන්ගෙන් සහ වෘත්තියමය ආයතනවල නියෝජිතයින්ගෙන් එම පාලක සභාව සමන්විත වී තිබේ. එහි සභාපති ධුරය දරන්නේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසිනි.

**පාලක සභාවේ කැඳවුම්කරු වන  පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂවරයා ආයතනයෙහි ප්‍රධාන විධායක නිලධාරියාද වේ. පාලක සභාවේ පොදු මගපෙන්වීම යටතේ ඔහු කටයුතු කරනු ලැබේ. අධ්‍යක්ෂවරයාගේ සහායට උපදේශක කණ්ඩායමක්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු, ගණකාධිකාරිවරයෙක් මෙන්ම සහාය කාර්යමණ්ඩලයක් ද සිටී.**

**පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය වත්මනෙහිදි ප්‍රධාන අංශ 9 ක් යටතේ සංවිධානය වී තිබේ. ඒවා නම්, ප්‍රධාන කළමනාකරණ සහ මානව සම්පත් කළමනාකරණ අංශය, ඉංජිනේරු අංශය, භෞතික සැලසුම් අංශය, මූල්‍ය කළමනාකරණ අංශය, නෛතික හා ව්‍යවස්ථා සම්පාදක අංශය, පර්යේෂණ සහ ප්‍රකාශන අංශය, ආයතනික ශක්‍යතා වර්ධන අංශය, පරිපාලන අංශය සහ ගිණුම් අංශය වේ.**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි කළමනාකාරිත්ව ව්‍යුහය




***** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමගින් සිදුකළ සාකච්ඡා අනුව මෙම කළමනාකාරීත්ව ව්‍යුහය සංශෝධනය කෙරෙනු ඇත.*

## 1.6. 2017 වර්ෂයේදී ආයතනයේ සේවක සංඛ්‍යා තත්වය

**වර්ෂයේදී ආයතනයේ සමස්ත සේවක සංඛ්‍යා සැකසුම පහත පරිදි වේ.**

1 වගුව

| අංශය | අනුමත සේවක සංඛ්‍යාව | | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | විධායක | විධායක නොවන | එකතුව | විධායක | විධායක නොවන | එකතුව |
| පරිපාලන අංශය | 09 | 18 | 27 | 06 | 14 | 20 |
| ඉංජිනේරු අංශය | 02 | -- | 02 | 02 | -- | 02 |
| කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය | 02 | -- | 02 | 01 | -- | 01 |
| භෞතික සැලසුම් අංශය | 02 | -- | 02 | 01 | -- | 01 |
| මූල්‍ය කළමනාකරණ අංශය | 02 | 01 | 03 | -- | 01 | 01 |
| නෛතික හා ව්‍යවස්ථාදායක කටයුතු අංශය | 02 | -- | 02 | 01 | -- | 01 |
| පර්යේෂණ අංශය | 03 | -- | 03 | 03 | -- | 03 |
| පුහුණු අංශය | 02 | 01 | 03 | 02 | -- | 02 |
| ගිණුම් අංශය | 02 | 03 | 05 | 01 | 03 | 04 |
| එකතුව | | | **49** | එකතුව | | **35** |

## 2.0. පසුබිම

### 2.1. පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය පිළිබඳ හැඳින්වීම

මෙම ආයතනයේ මූලික අරමුණ වන්නේ මහජනතාවට කාර්යක්ෂම හා සතුටුදායක සේවාවක් ඉටු කිරීමට හැකිවනු පිණිස පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල කළමනාකරණ හා ආයතනික කාර්යසාධන තත්ත්වයන් වර්ධනය කිරීමයි. 1987 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද 13 වන සංශෝධනයත් සමගින් පාලන බලතල විමධ්‍යගත කිරීම ආරම්භ විය. පාලන බලය පැවරීමේ අරමුණ නිසි පරිදි සාක්ෂාත් කරගැනීම සඳහාත් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අරමුණු ඉටු කරගැනිම සඳහාත්, පවරන ලද බලය විධිමත් අයුරින් ක්‍රියාවේ යෙදවීම අත්‍යවශ්‍ය කොන්දේසියක් වේ. ඒ අනුව, එමගින් පළාත් සභා මට්ටමෙන් ආයතනික පාලන කාර්යභාරයක් ස්ථාපනය කරනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

ඉහත සඳහන් කළ අන්දමින් පළාත් පාලනය පිලිබඳව ශ්‍රී ලංකා ආයතනය ඇති කර දැනට වර්ෂ දහ නවයක් (19) ගත වී තිබේ. මෙම කාලසීමාව තුලදී ආයතනය විසින් ක්‍රියාත්මක කළ යුතු සැලසුම් එය විසින් නිසි පරිදි දියත් කර ඇති අතර, එහි පාලක මණ්ඩලයේ මගපෙන්වීම යටතේ ආයතනයේ අරමුණු හා ඉලක්ක ඵලදායී අන්දමින් සංකල්පගත කිරීමට ආයතනය සමත් වී තිබේ. සිය සංකල්පගත ඉලක්ක සහ අරමුණු කෙටි කාලයක් තුළදී සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයට ජාත්‍යන්තර පළාත් පාලන ආයතනවල මෙන්ම දේශීය පුහුණු ආයතනවලද නොමඳ සහාය ලැබී තිබේ. ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ලබා දෙන දායකත්වය, විශේෂයෙන්ම උපදේශන කාර්යමණ්ඩලයේ සහ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ දායකත්වය ආයතනයේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහෝපාකාරී වී ඇත.

කෙසේ වුවද, විමධ්‍යගත කිරීමේ වැඩපිලිවෙල, විශේෂයෙන්ම එය ක්‍රියාත්මක කිරීමේ කාර්යයේදී තරමක් දුරට දුරස්ථ වී ඇති බවක් පෙනේ.

- විමධ්‍යගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, කාර්යක්ෂමතාවය වර්ධනය වන බව සහ ඉක්මනින් සපුරාලිය යුතු හා ප්‍රමුඛතාවය ලබා දිය යුතු සමාජ අවශ්‍යතා ආමන්ත්‍රණය සඳහා සම්පත් බෙදා හැරෙන බව සහතික කිරීම

- විමධ්‍යගත කිරීම තුලින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ලැබෙන්නා වූ ප්‍රතිචාර වර්ධනය කිරීමේ හැකියාව සහ ඉලක්ක කණ්ඩායම්වල අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

- දරිද්‍රතාවය අවම කිරීමේදී සහ සංවර්ධන ක්‍රියාකාරකම් තුලදී විමධ්‍යගත කිරීම තුලින් ලැබිය හැකි සඵලදායී තත්ත්වය

- විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පීඩා විඳින ජනතාව හා පුරවැසියන් කෙරෙහි ලබ ා දෙන ප්‍රමුඛතාවය පිලිබිඹු වන අන්දමින් මෙම මට්ටම් වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම

- බිම් මට්ටමේ ජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා එම ප්‍රජාවන්හි දායකත්වයද ඇතිව තීරණ ගැනීම පිළිබඳව සැලකිලිමත් වීම

ඒ අනුව, සෑම වර්ෂයකදීම ඉලක්කය වනු ඇත්තේ පළාත් පාලන ආයතන කැප වී සිටින්නා වූ පළාත් මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමය කරා ය ාම සඳහා ඒවාට මග පෙන්වීම සහ ඊට උචිත වන පරිදි පළාත් පාලන ආයතනවල සහ පළාත් සභාවල ශක්‍යතා වර්ධන ක්‍රියාවලීන් හැඩගස්වා ගැනිම වේ.

## 2.2. ආයතනික පාලන ප්‍රකාශනය

| | | |
|---|---|---|
| ආයතන නාමය | : | පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය<br>(1999 අංක 31 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපනය කරන ලදී) |
| මෙහෙයුම් අරඹන ලද දිනය | : | 15.10.1999 |
| ලියාපදිංචි කාර්යාලය | : | අංක. 17, මලලසේකර මාවත,<br>කොළඹ 07. |
| විගණකවරු | : | විගණකාධිපති<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| බැංකුකරුවන් | : | ලංකා බැංකුව<br>නිදහස් චතුරස්‍ර ශාඛාව<br>කොළඹ 07. |
| විදේශීය සංගම් | : | (අ) පොදු රාජ්‍ය මණ්ඩලීය පළාත් පාලන සංසදය (CLGF)<br>(ආ) ආසියා හා ශාන්තිකර කළාපීය පළාත්පාලන පුහුණු සහ පර්යේෂණ ජාලය (LOGOTRI) |

දේශීය සංගම් : අ) ආසියා පදනම - කොළඹ
ආ) CHRYSALIS
ඇ) සර්ච් ෆො කොමන් ග්‍රවුන්ඩ්ස් (SFCG)
ඈ) USAID – SDGAP
ඉ) UNHABITAT

අනුබද්ධිත ව්‍යාපෘති : අ) ශ්‍රී ලංකාවේ නගරවල තත්වය ව්‍යාපෘතිය
ආ) සීමා නැවත සළකුණු කිරීමේ ව්‍යාපෘතිය
ඇ) පුරවැසියන් සමගින් සම්බන්ධවීම තුළින් ප්‍රතිපත්ති හා ක්‍රියාවන් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය
ඈ) NELSI ව්‍යාපෘතිය

**2.3.** **2017** ජනවාරි **01** වැනි දින සිට **2017** දෙසැම්බර් **31** වැනි දින දක්වා වූ පාලක සභාව

**නිලබලයෙන් පත් කරනු ලබන සාමාජිකයින් 8 දෙනෙකුගෙන් සහ පත් කරනු ලැබූ සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත වන සාමාජිකයින් 13 දෙනෙකුගෙන් පාලක සභාව සමන්විත වේ.**

**නිලබලයෙන් පත් කළ සාමාජිකයින් පහත දැක්වේ.**

- **එච්.ටී. කමල් පද්මසිරි මහතා**
  **ලේකම් - පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය - සභාපති**

- **ජේ. ජේ. රත්නසිරි මහතා (2016 ඔක්තෝබර් දක්වා) -සාමාජික**
  **ලේකම් - රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය**

  **වෙනුවෙන්**

- **බී.එම්.එම්. බස්නායක මිය**
  **අතිරේක ලේකම් - විමර්ශන, අධීක්ෂණ සහ පර්යේෂණ**
  **රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය**

- **එන්. ඩී. හෙට්ටිආරච්චි මහතා (2017 පෙබරවාරි දක්වා) -සාමාජික**
  **ලේකම් - නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය**

  **සහ**

  **සරත් චන්ද්‍රසිරි මහතා**
  **ලේකම් - නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය**

- **උදය ආර්. සෙනෙවිරත්න මහතා -සාමාජික**
  **ලේකම් - මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය**

- **ඩී. ස්වර්ණපාල මහතා -සාමාජික**
  **ලේකම් - අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

- **ආචාර්ය එම්.කේ.සී. සේනානායක මහතා (2016 ඔක්තෝබර් සිට ) -සාමාජික**
  **අධ්‍යක්ෂ - මූල්‍ය සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය**

- **ඩී.පී. හෙට්ටිආරච්චි මහතා -සාමාජික**
  **හිටපු අතිරේක ලේකම්, පළාත් සභා සහ පළාත්පාලන අමාත්‍යාංශය**

- **ඉසෙඩ්.ඒ.එච්. අහමඩ් මහතා -සාමාජික**
  **නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්**

- එන්.එම්.එම්. නින්සර් මහතා -සාමාජික
  සභාපති - ජේ අයි සී පෞද්. සමාගම

- අයි.පී.කේ. කෝරලගේ මහතා (2017 මැයි දක්වා ) -සාමාජික
  අංක 302/3, මීගස්මුල්ල, දැදිගමුව

- සුජීව සමරවීර මහතා -සාමාජික සහ කැඳවුම්කරු
  අධ්‍යක්ෂ - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

පාලක මණ්ඩලයේ ලේකම්

- නිරංජලා පෙරේරා මිය
  අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ අධ්‍යක්ෂ/ ප්‍ර.වි.නිලධාරීවරයාගේ පෞද්ගලික සහායක

## 2.4. විගණන සහ කළමනාකරණ කමිටුව

පහත දැක්වෙන සාමාජිකයින් විසින් 2017 වර්ෂයේ විගනන සහ කළමනාකරණ කමිටුවේ කටයුතු වල නිරත වන ලදී.

(අ ) ආචාර්ය එම්.කේ.සී. සේනානායක මහතා - සභාපති
අධ්‍යක්ෂ - මූල්‍ය සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
පාලක සභා සාමාජික

(ආ) රේනුකා එම්. වීරකෝන් මිය -සාමාජික
නීතිඥ
පාලක සභා සාමාජික

(ඇ) එන්.එම්.එම්. නින්සර් මහතා -සාමාජික
සභාපති - ජේ අයි සී පෞද්. සමාගම
පාලක සභා සාමාජික

(ඈ ) සුජීව සමරවීර මහතා -සාමාජික
අධ්‍යක්ෂ - පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

(ඉ ) රංජිත් ලියනාරච්චි මහතා
අභ්‍යන්තර විගණක - කැඳවුම්කරු
පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

බාහිර නිරීක්ෂකයින්

(ඊ) අශෝක ධනපාල මහතා
විගණන අධිකාරි - විගණකාධිපති දෙපාර්තමේන්තුව

(උ) එල්.එම්.ඩී. පද්මකිමාරි මිය
ප්‍රධාන අභ්‍යන්තර විගණක - පළාත්සභා හා පළාත්පාලන අමාත්‍යාංශය

විගණන සහ කළමනාකරණ කමිටුවේ ලේකම්

(ඌ). නිරංජලා පෙරේරා මිය
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ අධ්‍යක්ෂ/ ප්‍ර.වි.නිලධාරීවරයාගේ පෞද්ගලික සහායක

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්යමණ්ඩල සාමාජිකයින්

(එ) හිරාන් රදීෂ මහතා
ගිණුම් නිලධාරි/ සහකාර අධ්‍යක්ෂ (මුදල්) වෙනුවට ආවරණ රාජකාරි

(ඒ) අසේල සමරරත්න (2017 අගෝස්තු සිට)
පරිපාලන නිලධාරී

**3.0.** **අධිකාරී බලවරම සහ පළාත් සභා හා පළාත් පාලන ආයතනයන්හි කාර්යසාධනය වර්ධනය කිරීම සඳහා ආයතනයේ භූමිකාව සමාලෝචනය කිරීම**

**3.1.** **පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සපයනු ලබන උපදේශක සේවාව :**

උපදේශක සේවා ලබා දීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් ප්‍රධාන අංශ හතක් (07) පිහිටුවා තිබේ.

අ. ඉංජිනේරු.

ආ. පොදු කළමනාකරණ / මානව සම්පත් සංවර්ධනය

ඇ. භෞතික සැලසුම්

ඈ. මූල්‍ය කළමනාකරණය

ඉ. නෛතික සහ නීති සම්පාදන කටයුතු

ඊ. පර්යේෂණ සහ සංවර්ධන

එ. පුහුණු සහ සංවර්ධන

**3.2.** **3.2.** **ඉලක්ක කණ්ඩායම්**

ආයතනය විසින් සිදුකරනු ලබන පුහුණු, පර්යේෂණ සහ අනෙකුත් වැඩමුළු ආදියෙහි ප්‍රතිලාභීන් වන්නේ පළාත් සභා 9 සහ පළාත් පාලන ආයතන වේ. පළාත් පාලන ආයතනවල අපගේ අවධානය යොමුවන්නා වූ කාර්යාල සේවකයින්, ක්ෂේත්‍ර කාර්යමණ්ඩලය සහ විවිධ ශ්‍රේණිවල සේවකයින් 50000 ක් පමණ සිටිති.

ඉලක්කගත කර ඇති ඒ ඒ කණ්ඩායම් අනිකුත් කණ්ඩායම්වලට වඩා වෙනස්ය. පළාත් සංවර්ධන පුහුණු ඒකක සමගින් අදහස් හුවමාරු කරගෙන අවශ්‍යතාවයන්ට උචිත වන පරිද්දෙන් වැඩසටහන් සහ පුහුණු සැසි සැලසුම් කරනු ලැබේ. පළාත් මට්ටමින් වැඩ සටහන් සැලසුම් කිරීම සම්බන්ධයෙන් ද අප ආයතනය විසින් සහයෝගී කාර්යභාරයක් ඉටු කර ඇත.

**3.3.** **සම්බන්ධීකරණය සහ අධීක්ෂණය**

පළාත් කළමනාකරණ සංවර්ධන ඒකක මගින් සහ පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් පවත්වනු ලබන පුහුණුවීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම මෙම ආයතනයෙහි වැදගත් කාර්යභාරයක් වශයෙන් සැලකේ. පළාත් කළමනාකරණ සංවර්ධන ඒකකය සහ පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පවත්වනු ලබන මාසික සමාලෝචන රැස්වීම් හරහා මෙම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනයට කටයුතු කරනු ලැබේ.

*<u>පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පැවැත්වූ පළාත් කළමනාකරණ සංවර්ධන ඒකක රැස්වීම්</u>*





**3.4.** වයාපාර සංවර්ධනය

**පසුගිය අත්දැකීම්වලින් පෙනී ගොස් ඇති අන්දමට රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන ද බොහොමයක් ඔවුන්ගේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සහාය අපේක්ෂා කරති. මෙහිදී, ප්‍රතිඵල අරමුණු කරගත් ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා මේ සියලු ක්‍රියාකාරකම් තෝරා බේරාගැනීමකට ලක් කිරීම උවමනාය. මෙම ව්‍යාපාර සංවර්ධන කටයුතු අප ආයතනයෙහි අධ්‍යක්ෂවරයාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. අදාළ ආයතන සමගින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පාලක සභාවේද අනුමැතිය ලබා ගෙන එම වැඩසටහන් සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු අධ්‍යක්ෂවරයා විසින් සම්පාදනය කරනු ලැබේ.**

*<u>මොන්ගෝලියා ධූත කණ්ඩායමේ සංචාරය - 2017 මැයි 15</u>*



***<u>පළාත්සභා සහ පළාත්පාලන ආයතන සම්බන්ධයෙන් නිරීක්ෂණයට සහ අත්දැකීම් ලැබීමට නේපාල ධූත කණ්ඩායමේ අධ්‍යයන/ නිරීක්ෂණ චාරිකාව - 2017 මැයි 14</u>***



**3.5. ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු සහ අධ්‍යාපන ආයතන සමගින් ඇති සබඳතා**

**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ජාතික මෙන්ම ජාත්‍යන්තර ආයතන සමගද බැඳී පවතී. මෙම සම්බන්ධතාවයන් දෙපාර්ශවයේම යහපත උදෙසා පවත්වාගෙන යන ඒවා වේ. විදේශගත පුහුණු ලබා ගැනීම සඳහා වන අවස්ථා වැඩි දියුණු කිරීමට එසේ ඇතිකරගන්නා ලද සබඳතාවයන් මගින් පහසුකම් සලසා තිබේ. (CLGF) 2017 වසරේදී USAID, UN-HABITAT, CHRYSALIS, DFAT - ඕස්ට්‍රේලියා, ලෝක බැංකුව සහ යුරෝපීය සංගමය යනාදී සංවිධාන සමගන් තොරතුරු හුවමාරු කරගැනීමට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් අපේක්ෂා කරයි.**

USAID FROM THE AMERICAN PEOPLE — UN-HABITAT FOR A BETTER URBAN FUTURE — European Union — Chrysalis — Search for Common Ground

## 3.6. විශේෂ සිදුවීම්

නව මැතිවරණ ක්‍රමය සහ එම ක්‍රමය තුළ කාන්තා නියෝජනය සම්බන්ධයෙන් මහජනතාව අතරේ සහ ප්‍රජා මූලික සංවිධාන අතරේ දැනුවත්භාවය ඇතිකිරීම සඳහා වූ වැඩසටහන

ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් බහුතර කොටස කාන්තාවන්ගෙන් සමන්විත වුවද, පාර්ලිමේන්තුවේ, පළාත්සභාවල සහ පළාත්පාලන ආයතනවල කාන්තාවන්ගේ නියෝජනය සමස්ථ ජනගහනයෙන් ඉතාමත් අඩු ප්‍රතිශතයක් වේ. රටේ සමස්ථ ජනගහනයෙන් 50%-52% අතර ප්‍රතිශතයක් කාන්තාවන්ගෙන් සමන්විත වුවත් දේශපාලනයේ කාන්තා නියෝජනය 5%ට අඩු බව දත්තවලින් පෙන්නුම් කරයි.

මෙම නව ක්‍රමය පිළිබඳ උනන්දුවක් දක්වන අයවලුන් විසින් නිරන්තරයෙන් යොමුකරන ලද විමසීම්, ප්‍රශ්න සහ පැහැදිලිකිරීම් සංඛ්‍යාව සැලකිල්ලට ගත්කල මෙම ක්‍රමය සම්බන්ධයෙන් වන දැනුම සහ අවබෝධය කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වී තිබේ.

මේ හේතුවෙන්, නව මැතිවරණ ක්‍රමය යටතේ නාමයෝජනා ඉදිරිපත් කිරීම, කොට්ඨාස පදනමින් නියෝජිතයින් තෝරාගැනීම සහ පොදු ලැයිස්තුවෙන් නියෝජිතයින් තෝරාගැනීම මෙන්ම 2017 අංක 16 දරන පනත යටතේ කාන්තා නියෝජනය සම්බන්ධයෙන් තීරණය කිරීමට යොදවා ඇති අනිවාර්ය ක්‍රමවේදය පිළිබඳව දැනගතයුතු කරුණු හා තොරතුරු රටේ සෑම ප්‍රදේශයකම ජනතාවගේ දැනුවත්භාවය උදෙසා සමාජය දැනුවත්කිරීමේ වැඩසටහනක් දියත් කිරීමේ අවශ්‍යතාවයක් පැනනැගුනි.

මෙම ක්ෂේත්‍රයට සම්බන්ධව කටයුතු කරන මහකොමසාරිස් කාර්යාල, තානාපති කාර්යාල සහ ජාත්‍යන්තර හා රාජ්‍ය නොවන සංවිධාන සමගින් පැවති සාකච්ඡාවන්හි දී දේශපාලනයට කාන්තා සහභාගීත්වය දිරිගැන්වීම උදෙසා යොමුවී සිදුකරන සාමූහික වැඩසටහනක් සඳහා ස්වකීය පූර්ණ සහයෝගය ලබාදීමට ඔවුන් එකඟ වී තිබේ.









එහි ප්‍රතිඵලයක් වශයෙන්, පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වන අත්පොතක් මුද්‍රණය කර බෙදාහැරීම සඳහා USAID-SDGAP වෙතින් රු. 20,000,000/-ක දායකත්වයක් ලබාදෙනු ලැබිණි.

අ.) ශ්‍රී ලංකාවේ පළාත්පාලන ආයතන පිළිබඳ හැඳින්වීම

ආ.) පළාත්පාලන ආයතන විසින් නීති සෑදීම

ඇ.) පළාත්පාලන ආයතනවල විෂයපථය, බලතල, කර්තව්‍යයන් සහ වගකීම්

ඈ.) සහභාගීත්ව අයවැය සම්පාදනය, සමාජ වගවීම සහ සේවා ලබාදීම

ඉ.) සඵලදායී සහ කාර්යක්ෂම ආයතන වශයෙන් පළාත්පාලන ආයතන කළමනාකරණයෙහිලා පැති සහ තිරස් සම්බන්ධීකරණ යන්ත්‍රණ

ඊ.) පළාත්පාලන ආයතනවල සභා රැස්වීම්/ කාරක සභා කාර්යයපටිපාටි

උ.) පළාත්පාලන ආයතනයේ නගරාධිපති/ සභාපතිගේ, සභිකයින්ගේ, කොමසාරිස්/ලේකම්වරුන්ගේ භූමිකාව

ඌ.) පළාත්පාලන ආයතන සභිකයින්ගේ චර්යාව සම්බන්ධයෙන් වන නීතිමය විධිවිධාන (පනත් සහ ආඥාපනත්)

අළුතින් තෝරාපත්වන සභිකයින් අළුත් සභාවේ වැඩ ආරම්භ කිරීමට පෙරාතුව සභාවේ කටයුතු සම්බන්ධයෙන් ක්‍රමවත් පුහුණුවක් ඔවුන්ට ලබාදී තිබීම තුළින් ඔවුනට තමන්ගේ භූමිකාව සහ වගකීම් පිළිබඳ මනා අවබෝධයක් ඇතිවන අතර පොදුවේ ප්‍රජාවේ අභිමතාර්ථ සාක්ෂාත් කරදීමට එය පිටිවහලක් වනු ඇත. මෙම පුහුණුව කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දීර්ඝ කාලීන යනුවෙන් කාණ්ඩ තුනකට වෙන්කර තිබේ. එම පුහුණුව පහත දැක්වෙන අනුපිළිවෙලට පැවැත්වීමට අදහස් කරනු ලැබේ.

කෙටිකාලීන පුහුණුව - සමස්ථ දිවයිනේම දිස්ත්‍රික්ක 25හි පළාත්පාලන ආයතන සඳහා තෝරාපත් කරගත් සභිකයින් මැතිවරණ කොමිෂන් සභාවෙන් නිවේදනය කළ පසු නොපමාව මෙම මූලික හැඳින්වීමේ වැඩසටහන පවත්වනු ඇත. එක් වැඩමුළුවකට උපරිම 100-125ක් දක්වා වන සභිකයින් සංඛ්‍යාවක් ඇතුළත්වන සේ මෙම වැඩමුළු පැවැත්වීමට සැලසුම් කර තිබේ.






මධ්‍යකාලීන පුහුණුව - තිරසාර සංවර්ධන අරමුණු, යහපාලන මූලධර්ම, තොරතුරු දැනගැනීමේ පනත සහ සමාජ ස්ත්‍රීපුරුෂ සමාජභාව අන්තර්කරණය සහ ඊ-පළාත්පාලන වැඩසටහන පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම





දීර්ඝ කාලීන පුහුණුව - තෝරාපත්වූ සභිකයින් සඳහා වන, අනුමැතිය ලත් පළාත්පාලනය පිළිබඳ සහතිකපත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා

### 3.7. සහායක කාර්ය මණ්ඩලය වර්ධනය කර ගැනීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් ද ඇතුළුව පළාත්සභා හා පළාත්පාලන අමාත්‍යාංශය සමගින් සාකච්ඡා කිහිපයක්ම පැවැත්වූ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මේ වනවිටත් ස්වකීය සංවිධාන ව්‍යුහය නැවත සැලසුම් කිරීමට කටයුතු කර තිබේ. තවද, අපගේ එම යෝජනාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අප විසින් පියවර ගෙන ඇති අතර, දැනට එය සාකච්ඡාවෙමින් පවතියි.

කෙසේනමුත්, කාර්යමණ්ඩලයේ කාර්යසාධනය සහ කාර්යයන්හි ගුණාත්මක බව වැඩිදියුණු කිරීම පළාත් පාලන ක්ෂේත්‍රය තුළ කාර්යක්ෂම සහ සඵලදායී සේවාවක් සැපයීම සඳහා අත්‍යාවශ්‍ය වේ. එසේහෙයින්, කාර්යක්ෂම හා සඵලදායී සේවා සැපයුමක් සඳහා කාර්යමණ්ඩලයේ දැනුම සහ අවබෝධය වර්ධනය කිරීම සඳහා පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් ගණනාවක් සැලසුම් කර තිබේ.

පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කාර්යමණ්ඩලයේ ශක්‍යතාවය ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමට වැඩිදියුණු කරගැනීමට ඉවහල්වන්නා වූ බාහිර පුහුණු ද ආයතනයේ කාර්යමණ්ඩලයට ලැබේ.

**4.0 2017** වර්ෂය තුළ ආයතනයේ සමස්ථ කාර්ය සාධනය

ආයතනයෙන් ක්‍රියාත්මක කළ ජාතික මට්ටමේ වැඩසටහන්වල සාරාංශය **- 2017**

**2** වගුව

| | බස්නාහිර | වයඹ | උතුරු මැද | සබරගමුව | මධ්‍යම | දකුණු | ඌව | නැගෙනහිර | උතුරු | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉංජිනේරු | 04 | 04 | 03 | 03 | 04 | 03 | 03 | 04 | 03 | 31 |
| පොදු කළමනාකරණ | 05 | 04 | 04 | 03 | 05 | 04 | 04 | 04 | 03 | 36 |
| භෞතික සැලසුම් | 03 | 03 | 03 | 02 | 03 | 03 | 03 | 03 | 03 | 26 |
| මූල්‍ය කළමනාකරණ | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 04 | 02 | 20 |
| පර්යේෂණ | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 09 |
| නීති සහ නීති සම්පාදන | 03 | 03 | 03 | 03 | 03 | 03 | 03 | 03 | 03 | 27 |
| ශක්‍යතා වර්ධන | 04 | 13 | 03 | 02 | 11 | 04 | 03 | 00 | 00 | 40 |
| පුහුණු අංශ (පළාත් මට්ටමේ) | 03 | 03 | 04 | 02 | 03 | 04 | 06 | 03 | 03 | 31 |
| එකතුව | 25 | 33 | 23 | 18 | 32 | 24 | 25 | 22 | 18 | 220 |

ඉලක්ක කළ සහ සත්‍ය ප්‍රතිලාභීන්

1 රූපය




සියළු අංශවලට අයවැයෙන් වෙන්කළ මුදල් සහ ඒවායෙහි සත්‍ය වියදම

2 රූපය




**** ගාස්තු අයකරගැනීම් සඳහා වෙන්කළ මුදල් හැර සත්‍ය වියදම් ගණනය කර තිබේ.*

**2015, 2016 සහ 2017 වර්ෂ වල මූල්‍ය ප්‍රගතිය සන්සන්දනය**

3 රූපය




**ගතවූ වර්ෂ කිහිපයේ ලැබූ ලාභය/අලාභය**

4 රූපය



## 4.1. ආයතනයෙහි එක් එක් අංශයේ කාර්යසාධනය පිලිබඳ තොරතුරු

### 4.1.1. ඉංජිනේරු අංශය

- වෙන්කළ මුදල - රු. 3,540,000.00
- පරිහරණය කළ මුදල - රු. 2,779,566.34
- සම්පූර්ණ කළ වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව
  (පළාත් මට්ටමේ වැඩසටහන් ද ඇතුළුව ) - 31
- තත්‍ය ප්‍රතිලාභීන් - 1297
- පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය - 78.52%

පළාත් පාලන ආයතන වල කාර්මික අංශවල මෙන්ම පළාත් සභාවල ඉංජිනේරු අංශයන්හි කාර්යසාධනය වර්ධනය කිරීම භාරව කටයුතු කරන්නේ මෙම ඉංජිනේරු අංශය මගින් වේ. ආයතනික අභිමතාර්ථයන්ට අනුකූලව සිදු කෙරෙන පුහුණුවීම් සහ පර්යේෂණ යනාදිය හරහා මෙකී අරමුණ සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වේ.








ඉංජිනේරුවන්ට, වැඩ අධිකාරීන්ට සහ කාර්මික නිලධාරීන්ට අදාළ වන පරිදි තෝරා ගත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුහුණුවීම් ලබා දීමට මේ වසරේදී කටයුතු කරන ලදී. ඊට අමතරව, පළාත් සභාවලට අනුයුක්තව සේවය කරන ඉංජිනේරුවන්ට සහ කාර්මික නිලධාරීන්ට කුසලතා වර්ධනය සඳහා අදාළ වන්නා වූ වැඩසටහන් ද පවත්වන ලදී.

**4.1.2.** පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

- වෙන්කළ මුදල - රු. 3,050,000.00
- පරිහරණය කළ මුදල - රු. 2,191,242.39
- සම්පූර්ණ කළ වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව
- (පළාත් මට්ටමේ වැඩසටහන් ද ඇතුළුව ) - 36
- තත්‍ය ප්‍රතිලාභීන් - 1673
- පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය - 71.84%








ශ්‍රී ලංකාවේ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල තෝරා පත් කර ගත් සභිකයින් සහ කාර්යමණ්ඩලයේ කළමනාකරණ හැකියාවන් වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පොදු කළමනාකරණ අංශය ස්ථාපිත කර තිබේ. මෙම අංශය මගින් පළාත් සභා වල සහ පළාත් පාලන ආයතනවල වත්මන් ශක්‍යතා වර්ධන අවශ්‍යතාවයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ආයතනමය සවිබලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. දේශපාලන නායකයින්, රජයේ නිලධාරීන් සහ සිවිල් සමාජය තුළ බලය බෙදා හැරීම සහ යහපාලනය පිළිබඳ ඇති පොදු අවබෝධය වර්ධනය කිරීම සඳහා මෙහිදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ. ජාතික මට්ටමින් පවත්වාගෙන යනු ලබන වැඩසටහන්වලට අමතරව අවශ්‍යතාවයන්ට සරිලන පරිදි විශේෂිත වැඩසටහන්ද හඳුන්වාදීමට කටයුතු කරනු ලැබේ.

මෙම අංශයෙහි අභිමතාර්ථ :

- ❖ ප්‍රජාවට වඩාත් විශිෂ්ඨ වූ සේවාවක් සපයා දීම සඳහා, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට තෝරා පත් කර ගත් සභිකයින්ගේ සහ ඒවායේ සේවය කරන නිලධාරීන්ගේ කාර්යසාධනය වැඩි දියුණු කර, ඔවුන්ගේ ආකල්ප පරිවර්තනයකට භාජනය කිරීමේ අරමුණින් ඔවුන්ගේ ශක්‍යතා වර්ධනය

- ❖ උප ජාතික මට්ටමේදී සංවර්ධනය සඳහා වන බාධක වෙතොත් ඒවා ඉවත් කිරීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය අංශ අතර හවුල්කාරිත්ව වර්ධනය

- ❖ මහජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබා දීමටත්, අනෙකුත් පාරිභෝගිකයින් තෘප්තිමත් කිරීමටත්, ආයතනවල කාර්යක්ෂමතාවය, සඵලදායිත්වය සහ ඵලදායිතාවය වර්ධනයට කටයුතු කිරීම

දිවයින තුල මෙන්ම කළාපයේද පළාත් පාලනය සම්බන්ධයෙන් වන යහපරිචයන් මනාව සලකා බැලීමෙන් අනතුරුව, සෑම වසරේම ක්‍රියාත්මක සැලසුම සම්පාදනය කරගනු ලැබේ. විශේෂයෙන්ම වත්මන් වාතාවරණය ගත් කල පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල පවතින ශක්‍යතා මට්ටම් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

### 4.1.3. භෞතික සැලසුම් අංශය

භෞතික සැලසුම් ක්ෂේත්‍රයෙහි දැනුම, ආකල්ප, නිපුණතා සහ සේවා තත්ත්වයන් මෙන්ම පුහුණු සහ උපදේශක සේවාවන් පිලිබඳ දැනුම වර්ධනය කරමින් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සහ පළාත් සභා වල දේශපාලන නියෝජිතයින්ගේ සහ අදාළ වෙනත් නිලධාරින්ගේ කාර්යසාධනය වර්ධනය කිරීම පිණිස කටයුතු කිරීම මෙම අංශයේ ප්‍රධාන අභිමතාර්ත්‍ය වේ. මේ හරහා අවසාන වශයෙන් අරමුණු කරගෙන ඇත්තේ අදාළ ප්‍ර දේශය තුල ජීවත්වන්නා වූ ජනතාවගේ ජීවන මට්ටම සහ පරිසරය වඩාත් යහපත් තත්ත්වයකට ගෙන ඒම වේ.

- වෙන්කළ මුදල - රු. 3,050,000.00
- පරිහරණය කළ මුදල - රු. 1,850,416.46
- සම්පූර්ණ කළ වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව
  (පළාත් මට්ටමේ වැඩසටහන් ද ඇතුළුව ) - 26
- තත්‍ය ප්‍රතිලාභීන් - 1267
- පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය - 60.67%

  

**4.1.4** මූල්‍ය කළමනාකරණ අංශය

- වෙන්කළ මුදල (රු. '000) - රු. 3,940,000.00
- පරිහරණය කළ මුදල (රු. '000) - රු. 2,961,696.34
- සම්පූර්ණ කළ වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව
  (පළාත් මට්ටමේ වැඩසටහන් ද ඇතුළුව ) - 20
- තත්‍ය ප්‍රතිලාභීන් - 970
- පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය - 75.17%

මූල්‍ය කළමනාකරණ අංශයේ අවධානය ප්‍රධාන වශයෙන් යොමුවන්නේ පහත කරුණු කෙරෙහි වේ;



✧ මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පළාත් පාලන අයතනවල කාර්යමණ්ඩලය සතු දැනුම සහ අවබෝධය වර්ධනය කිරීම

✧ තෝරාපත් කර ගනු ලැබූ සභිකයින්ට මූල්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළු පැවැත්වීම

✧ මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය උපදෙශන සේවා සැපයීම

✧ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම

මේ කරුණු සම්බන්ධයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සකස් කර ඇති වැඩසටහන් පළාත් පාලන ආයතනවල කාර්යසාධනය නැංවීම සඳහා මහෝපකාරී වී තිබේ. මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වන පුහුණු සඳහා වන ඉල්ලුම තවමත් පවතී. ඒ අනුව අවශ්‍යතාවයන් මත පදනම් කරගෙන සකස් කරන ලද පුහුණුවීම් පැවැත්වීමට ආයතතනය විසින් කටයුතු කර ඇති අතර ඊට අදාළ විෂයපථයන් පහත දැක්වේ.





- ✧ මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම
- ✧ අයවැය සැකසීම, අයවැය පාලනය සහ අධීක්ෂණය
- ✧ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් පිළිබඳ දැනුවත්කිරීම සහ ඒවා යොදාගැනීම
- ✧ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීම
- ✧ ශ්‍රී ලංකාවේ විගණනය සහ විගණන ප්‍රමිතින් පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම
- ✧ අභ්‍යන්තර පාලන විධි පිළිබඳ දැනුවත්වීම
- ✧ පළාත් පාලන මූල්‍ය කමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම

**4.1.5** **නෛතික සහ ව්‍යවස්ථා සම්පාදක කටයුතු අංශය**

- **වෙන්කළ මුදල (රු. '000)** - රු. 2,950,000.00
- **පරිහරණය කළ මුදල (රු. '000)** - රු. 2,064,700.39
- **සම්පූර්ණ කළ වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව (පළාත් මට්ටමේ වැඩසටහන් ද ඇතුළුව )** - 27
- **තත්‍ය ප්‍රතිලාභීන්** - 1278
- **පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය** - 70%

**ශ්‍රී ලංකාවේ උප ජාතික මට්ටමේ පාලන තලය තුළ තෝරා පත් කරගත් සභිකයින් සහ නිලධාරීන්ගේ ව්‍යවස්ථා සම්පාදක හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ නෛතික සහ ව්‍යවස්ථා සම්පාදක කටයුතු අංශය බලවරම් ලබා තිබේ. රටේ උප ජාතික තලය සමන්විත වන්නේ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලින් වන අතර ඒවාට අදාළ පාලන නීති විධිවිධාන හරහා එම ආයතන නෛතික බලවරම් ලබා ඇත. එමනිසා එකී ආයතනවල සංයුතිය, සංස්ථාපනය, බලතල සහ කාර්යභාරයන් ව්‍යවස්ථාදායක පදනමක් මත ගොඩනැගී තිබේ.**

**පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට තෝරා පත් කර ගෙන ඇති සභිකයින්ට සහ ඒවායේ සේවය කරන නිළධාරීන්ට අනු නීති සහ නීති කෙටුම්පත් කිරීම, සමාලෝචනය කිරීම, වලංගු කිරීම සහ අනුමත කිරීම සඳහා වන ව්‍යවස්ථාදායක හැකියාවන් මෙන්ම පවතින නීති දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම් සඳහා අදාළ කර ගැනීම සම්බන්ධයෙන් වන හැකියාව ද දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය කර තිබේ. පුළුල් පරාසයක වන නෛතික ගැටළු, අක්‍රමිකතා, අවබාවිත සහ නීති උල්ලංඝන වලට මුහුණ දීම සඳහා පළාත් සභා පළාත් පාලන ආයතන වලට මග පාදන්නා වූ බරපතල අඩුපාඩුවක් වශයෙන් මෙය හඳුනාගෙන තිබේ.**




**පළාත් පාලන ආයතන සහ පළාත් සභා වල පවතින තත්ත්වය, පුහුණු අවශ්‍යතා සහ වුවමනාවන් හඳුනාගැනීමෙන් සහ ඇගයුම් කිරීමෙන් අනතුරුව ඒවා සඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීමේ අරමුණ ඇතිව නෛතික සහ ව්‍යවස්ථාදායක කටයුතු අංශයේ වැඩසටහන් විශේෂයෙන්ම නිර්මාණය කර තිබේ.**

තවද, රටේ සාමාන්‍ය නිතිය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනවල පවතින දැනුම් අඩුපාඩුව සපුරාලීම අරමුණු කරගෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අනු නීති, පරිපාලන නීතිය, අධිකරණ කාර්යපාටිපාටිය, සහ පළාත් පාලන ආයතනවල සභා කටයුතු යනාදිය පිලිබඳ විශේෂ අවධානයක් යොමු කරන්නා වූ 'පළාත් පාලන නීතිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව' නම් වූ නව පාඨමාලාවක් 2015 වර්ෂයේදී හඳුන්වාදුන් අතර එය 2016 වර්ෂයේදී ද ඉදිරියට කරගෙන යනු ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අතුරු ව්‍යවස්ථා, පරිපාලන නීතිය, අධිකරණ කාර්යපටිපාටිය සහ පළාත්පාලන ආයතනවන කටයුතු යනාදිය පිළිබඳව වඩාත් ගැඹුරින් අවධාරණය කරමින් රටේ නීතිය සම්බන්ධයෙන් ප්ළාත්පාලන ආයතන සතු දැනුමේ ඇති අඩුපාඩු සම්පූර්ණ කිරීමට මෙය උපකාරී වනු ඇත. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ව්‍යවස්ථාදායක හැකියාවන් ශක්තිමත් කිරීමේ පොදු අභිමතාර්ථය කෙරෙහි අවධානය යොමු කරමින් පහත දැක්වෙන්නා වූ විශේෂිත අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සම්බන්ධයෙන් මෙම අංශය කටයුතු කරනු ලැබේ.

**4.1.6.** පුහුණු අංශය

- වෙන්කළ මුදල (රු. '000)(ජාතික හා පළාත්) = රු. 6,100,000.00
- පරිහරණය කළ මුදල (රු. '000) = රු. 5,416,631.75
- සම්පූර්ණ කළ වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව (පළාත් මට්ටමේ වැඩසටහන් ද ඇතුළුව ) = 57
- තත්‍ය ප්‍රතිලාභීන් = 2616
- පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය = 88.80%

ආයතනයේ පුහුණු අංශය විසින් නිලධාරීන්ගේ සහ පළාත් සභා හා පළාත් පාලන අයතන වෙත තෝරා පත්කරගත් සභිකයින්ගේ මානව සම්පත් සංවර්ධනය සඳහා අහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදුකර ඇත.

- ➢ පුහුණු අවශ්‍යතා ඇගැයුම
- ➢ ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීම
- ➢ පුහුණු අත්පොත් හා මොඩියුල සම්පාදනය
- ➢ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ➢ පළාත්සභා සහ පළාත් පාලන ආයතනවල සභිකයින් හා නිලධාරීන් සඳහා වැදගත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුහුණු සංවිධානය කිරීම
- ➢ පළාත් පාලනය පිළිබඳ ජාතික මට්ටමේ ඩිප්ලෝමා/ සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම

- පළාත් පාලනය පිළිබඳ තොරතුරු බෙදාහැරීම
    - ත්‍රෛමාසික පුවත් ලිපිය (දෙමළ/ සිංහල)
    - පාලන ජර්නලය (වාර්ෂික)
- පළාත් පාලනය පිළිබඳ යාවත්කාලීන කළ පුස්තකාලයක් ඇතිකර පවත්වාගෙන යාම
- පළාත් සභා සහ පළාත් පාලන පුහුණු පැවැත්වීම සඳහා කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සහ පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ ශක්තිය වර්ධනය සහ ඔවුනට සහය ලබාදීම
- කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකක සහ පළාත් පාලන කොමසාරිස්වරුන් පළාත් මට්ටමින් පවත්වන පුහුණු සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගැයුම

*<u>සහතිකපත්‍ර හා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය - 2017</u>*






*<u>සමාරම්භක උත්සව</u>*




**4.1.7.** **පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ ශක්‍යතා වර්ධනය**

**පසුගිය වසර දහ නවයක (19) කාලයක් මුළුල්ලේ විවිධ සන්ධිස්ථාන පසුකරමින් පැමිණි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මේ දක්වා තමන් සාක්ෂාත් කරගෙන ඇති කාර්යසාධනය දෙස නැවත හැරී බලා, එහි විශේෂිත වැඩසටහන් සම්බන්ධයෙන් සිදුකෙරෙන කාර්යභාරයට මග පෙන්වීම සඳහා එම අභ්‍යාසයේ ප්‍රතිඵල භාවිතා කිරීම වැදගත් වේ. එමෙන්ම, එහි ඉලක්ක සහ අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමේදී ආයතනය මගින් ඇති කර තිබෙන බලපෑම කෙබඳු වේදැයි ඇගයුම් කිරීමේ අවශ්‍යතාවයක්ද පවතී. හුදෙකලාවීමකින් තොරව ආයතනයේ කාර්යභාරයන් ඉටු කිරීමට අපේක්ෂා කරන ලදී.**

- වෙන්කළ මුදල (රු. ‘000) - රු. 4,970,000.00
- පරිහරණය කළ මුදල (රු. ‘000) - රු. 1,970,136.10
- පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය - 39.64%

*කණ්ඩායම් කුසලතා වර්ධන වැඩසටහන (Outbound Training)*









**4.1.8.** **පර්යේෂණ සහ සංවර්ධන අංශය**

**පළාත් පාලන සහ පළාත් සභා ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ට අවශ්‍ය කරන තොරතුරු සහ ප්‍රතිඵල ඒ සම්බන්ධයෙන් සිදු කෙරෙන පර්යේෂණ සහ සමීක්ෂණ හරහා බෙදා හැරීම තුලින් පළාත් පාලන ආයතන සහ පළාත් සභාවන්ට අවශ්‍ය  සහාය ලබාදීම කෙරෙහි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පර්යේෂණ අංශය විසින් මූලිකවම සැලකිලිමත් වේ.  ඊට අමතරව තම පර්යේෂණ හරහා  සොයා ගත් කරුණු මත පදනම් වෙමින් පුහුණු වැඩසටහන් හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරතවීමටද මෙම අංශය කටයුතු කරයි.**

- වෙන්කළ මුදල (රු. '000) - රු. 4,500,000.00
- පරිහරණය කළ මුදල (රු. '000) - රු. 3,240,009.67
- සම්පූර්ණ කළ වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව
  (පළාත් මට්ටමේ වැඩසටහන් ද ඇතුළුව ) - 09
- තත්‍ය ප්‍රතිලාභීන් - 366
- පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය - 72%

අභිමතාර්ථ :

- ❖ පළාත් පාලන ආයතන සහ පළාත්සභා වැඩිදියුණු කර ඒවායේ ශක්‍යතාව වර්ධනය සඳහා එම ආයතන පිළිබඳ පර්යේෂණ අධ්‍යයන සිදුකිරීම සහ ප්‍රවර්ධනය
- ❖ පර්යේෂණ හරහා සොයාගත් කරුණු අදාළ ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ක්‍රියාත්මක කිරීමේ ආයතන අතර බෙදා හැරීම
- ❖ පාලනය සම්බන්ධයෙන් වන ජාතික මට්ටමේ මෙන්ම ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ ආයතන සමග සම්බන්ධ වීම.
- ❖ නව පර්යේෂණ මුල්පිරීම් සඳහා වැදගත් වන අංශ හඳුනා ගැනීම .
- ❖ පළාත් සභා සහ පළාත් පාලන ආයතන සම්බන්ධ දත්ත පදනමක් පවත්වාගැනීම.
- ❖ පර්යේෂණ  නිමැවුම් ලේඛනගත කිරීම.
- ❖ පළාත්පාලනය සහ පළාත් සභා විෂයයට අදාළ ප්‍රකාශන නිකුත් කිරීම.
- ❖ ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් පළාත් පාලන ආයන සහ පළාත් සභාවල අදාළ නිලධාරීන්ට පර්යේෂණ ක්‍රමවේදය පිලිබඳ පාඨමාලා පැවැත්වීම
- ❖ පර්යේෂණ හරහා සොයාගත් කරුණු මත පදනම් වෙමින්, පළාත්පාලන ආයතන සහ පළාත් සභාවල තෝරා පත් කරගත් සභිකයන් සහ ඒවායේ සේවයකරන නිලධාරීන්ට සංවර්ධනය සම්බන්ධ ගැටලු පිළිබඳව අවශ්‍ය කරන පුහුණු ලබා දීම

**පර්යේෂණ අධ්‍යයන - 2017 වර්ෂය**

2017 වර්ෂය - ** පළාත්සභා ලැයිස්තුවේ එන විෂයයන් 21 යටතේ පැවරෙන බලතල හරහා ආදායම වැඩිදියුණු කරගැනීම සඳහා පළාත්සභාවල දායකත්වය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය

** පළාත්පාලන ආයතනවල ගිණුම්කරණ ක්‍රමයෙහි සහ ඒ සම්බන්ධයෙන් වන වත්මන් පරිචයන්හි නීතිමය රාමුව පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය

**4.1.9.** **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය**

වෙබ් අඩවිය, LAN ජාලය, දත්ත පදනම් සහ පරිගණකවල දෘඩාංග හා මෘදුකාංග කළමනාකරණය සඳහා වගකියනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය, පළාත්පාලන ආයතන කාර්යමණ්ඩලය අරමුණු කරගෙන සිදුකරන ප්‍රතිසංස්කරණමය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු සඳහා ද සම්බන්ධ වේ.





**කාර්යයන්**

- ආයතනයේ සහ පළාත්පාලන ක්ෂේත්‍රයේ කාර්යමණ්ඩලයට ඊමේල් සහ අන්තර්ජාල පහසුකම් සැපයුම
- පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වෙබ් අඩවිය සංවර්ධනය සහ පවත්වාගෙන යාම
- ආයතනයේ පරිගණක සහ LAN ජාලය නඩත්තුව
- තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව වැඩිදියුණු කිරීම සඳහා පළාත්පාලන ආයතන කාර්යමණ්ඩලය පුහුණු කිරීම
- ඊමේල් හා අන්තර්ජාලය හරහා නිල තොරතුරු බෙදාහැරීම
- අමාත්‍යාංශයට සහ ආයතනවලට තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවන් ලබාදීම



| | |
|---|---|
| වෙන්කළ මුදල (රු. '000) | - රු. 2,900,000.00 |
| පරිහරණය කළ මුදල (රු. '000) | - රු. 1,989,116.52 |
| සම්පූර්ණ කළ වැඩසටහන්/ වැඩමුළු සංඛ්‍යාව (පළාත් මට්ටමේ වැඩසටහන් ද ඇතුළුව ) | - 31 |
| සත්‍ය ප්‍රතිලාභීන් | - 1048 |
| පරිහරණය කළ අරමුදල් ප්‍රතිශතය | - 68.60% |

## 4.2. පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සම්පූර්ණ කරන ලද පැවරුම්/ ව්‍යාපෘති සහ උපදේශක සේවා - 2017 වර්ෂය

4.2.1. සිතියම්ගත කිරීමේ අභ්‍යාස : 

** කාන්තාවන් සවිබල ගැන්වීමේ පාර්ශවකරුවන් විසින් සිදුකළ පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් සිදුකළ සිතියම්ගත කිරීමේ අභ්‍යාසය

** පාර්ශවකරුවන් විසින් සිදුකරන ප්‍රජා පාලන වැඩසටහන් සම්බන්ධයෙන් සිදුකළ සිතියම්ගත කිරීමේ අභ්‍යාසය

4.2.2. ව්‍යාපෘති : අ.) <u>ශ්‍රී ලංකාවේ නගරවල තත්වය</u>



මෙම ශ්‍රී ලංකාවේ නගරවල තත්වය' යන ව්‍යාපෘතිය පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සහ එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන එක්ව පළාත්පාලන හා පළාත්සභා සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ඕස්ට්‍රේලියානු රජයේ මූල්‍යාධාර ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියකි.



ශ්‍රී ලංකාවේ නගරවල තත්වය' ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘතියක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළමු වතාව මෙය වන අතර, දිවයිනේ පළාත් නවයේ ප්‍රධාන නගර නවය සම්බන්ධයෙන් විස්තීර්ණ විශ්ලේෂණයක් මෙහිදී සිදුකරනු ලැබේ. විශේෂයෙන්ම එම නගර සම්බන්ධයෙන් අවකාශමය සහ සංඛ්‍යානමය දත්ත එක්ම වාර්තාවකට කැටි කොට ප්‍රතිපත්ති සම්පාදකයින්ට තම ඉදිරි තීරණ ගැනීමට යම් ආකාරයකින් මගපෙන්වාදීමක් එයින් සිදුවන අතර, එම නගර සඳහා වඩාත් හොඳ සමාජ, පාරිසරික සහ ආර්ථික ප්‍රතිඵල අත්කරදීම සඳහා ශක්තිමත් සාක්ෂි පදනමක් ද එයින් සලසා දෙනු ලැබේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අමාත්‍යාංශ කිහිපයක ලේකම්වරුන් සහ අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් විසින් මෙම ව්‍යාපෘතියට මගපෙන්වනු ලැබේ.



ප්‍රධාන අංග හතරක් යටතේ මෙම ව්‍යාපෘතිය සිදුකිරීම සඳහා පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට ඇමරිකානු ඩොලර් 30,122ක් ලැබී තිබේ.

1 වැනි අංගය: ව්‍යාපෘති කළමනාකරණය සහ උපකාර
2 වැනි අංගය: දත්ත පවතින්නේදැයි තක්සේරු කිරීම
3 වැනි අංගය: දත්ත එක් රැස් කිරීම
4 වැනි අංගය: දත්ත සම්බන්ධයෙන් ශක්‍යතා වර්ධනය

පළාත් පාලන ආයතන බලධාරීන් සහ අදාළ අනෙකුත් නිලධාරීන් සඳහා නාගරික දත්ත  එක් රැස් කිරීම, යාවත්කාලීන කිරීම, විශ්ලේෂණය සහ පරිහරණය නාගරික ජනාවාස, ජනවිකාශනය, ආර්ථිකය, පරිසරය, නාගරික සම්බන්ධතාවය, නගරසභා සේවාවන්, නාගරික පාලනය සහ නිවාස යනුවෙන් නගරවල වත්මන් තත්වය සහ පවතින ප්‍රශ්න සම්බන්ධයෙන් විශ්ලේෂණයක් ලබාදෙන්නා වූත්, වඩාත් යහපත් නාගරික අනාගතයක් වෙනුවෙන් සියළුම ශ්‍රී ලාංකිකයින්ට මග පෙන්වන්නාවූත් පරිච්ඡේද අටකින් 'ශ්‍රී ලංකාවේ නගරවල තත්වය 2018 වාර්තාව" සමන්විත විය.

**** මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතියි*

**ආ.)** <u>තත්ත්ව විශ්ලේෂණ වැඩසටහන</u>

මෙය, කෙයාර් ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා සහ පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය අතට ඇතිකරගත් ද්වීපාර්ශවීය එකඟතාවයක් අනුව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. මෙහි පොදු අරමුණ නම් මධ්‍යම සහ ඌව පළාත්වල තේවතුවල වාසය කරමින් ඒවායෙහි වැඩ කරන්නා වූ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය කිරීමයි. එහිදී පහත අංශ කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කෙරේ:

(i) කාන්තා අයිතිවාසිකම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින්, වතුකරයේ ජනතාව වෙත බලපාන අන්දමින් ප්‍රතිපත්තිවලට වෙනසක් ඇතිකිරීම සඳහා ජාතික මට්ටමේ සංවාදයක් පෝෂණය කිරීම

(ii) භාෂා අයිතිවාසිකම් සහ සිවිල් සමාජ සංවිධානවල ශක්‍යතා වර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් පළාත්පාලන ආයතනවල හැකියාවන්, ප්‍රතිචාරීබව සහ වගවීම වර්ධනය කිරීම තුළින් වතුකර ප්‍රදේශවල සහ ඒ ආසන්න ප්‍රදේශවල සේවා සැපයුම සඳහා පහසුකම් සැලසීම

මෙම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට රු. 1,149,323.52ක් ලැබී තිබේ. මෙහිදී ඉලක්කගත ප්‍රදේශ නම් මහනුවර, මාතලේ, නුවර එළිය යන මධ්‍යම පළාත් දිස්ත්‍රික්ක සහ බදුල්ල හා මොනරාගල යන ඌව පළාත් දිස්ත්‍රික්ක වේ.

**** මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතියි*

**ඇ.)** <u>පුරවැසියන් සම්බන්ධ කරගැනීම තුළින් ප්‍රතිපත්ති හා ක්‍රියාවන් ශක්තිමත් කිරීම</u> <u>**(SPACE)**</u>

මෙය, CRYSALIS සහ පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය අතට ඇතිකරගත් ද්වීපාර්ශවීය එකඟතාවයක් අනුව ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ අරමුණ නම් පාලනය සඳහා සක්‍රියව සහභාගිවීමට, තමන්ගේ සංවර්ධන ප්‍රමුඛතා තීරණය කිරීමට, විසඳුම් නිර්ණය කරගැනීමට සහ තමන්ගේ අවශ්‍යතා හා හිමිකම් ආමන්ත්‍රණය කිරීම සඳහා ඒවා සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට ආන්තිකරණය වූ ප්‍රජාවන්, විශේෂයෙන්ම අන්ත දුගී කාන්තාවන් හා තරුණ කොටස් සවිබල ගැන්වීමයි.




ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල ඇති "ප්‍රජාමණ්ඩලයන්හි" බහුවිධතාව අවබෝධ කරගැනීම සඳහා උපයෝගික ප්‍රවේශයක් සකසාගැනීමත් එම ප්‍රජාමණ්ඩලවලට මගපෙන්වීම සඳහා පළාත්පාලන ආයතනවලට ඇති විභවය ගවේෂණයත් මෙම SPACE ව්‍යාපෘතියෙන් සිදුකෙරේ.

මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල නම්:

අ.) ආන්තීකරණයට ලක්වූ ප්‍රජාවන් ප්‍රාදේශීය මට්ටමින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කරගැනීම සඳහා "ප්‍රජා මණ්ඩල" ස්ථාපිත කර සංස්ථාගත කිරීම.

ආ.) තීරණ ගැනීමේ ක්‍රියාවලියට ප්‍රජාව සම්බන්ධ කරගැනීමේ වැදගත්කම රජයේ නිලධාරීන් විසින් පිළිගෙන මෙම ව්‍යාපෘතිය සඳහා පහසුකම් සැලසීම

ඇ.) පරීක්ෂාවට ලක්වූ එම ආකෘතිය අනුව යමින් එය තවත් ස්ථානවල වඩාත් කාර්යක්ෂමව සහ සඵලදායී අන්දමින් රජයේ නිලධාරීන් විසින් ක්‍රියාවට නැංවීම.

ඈ.) ආයතනික ව්‍යුහයෙන් ප්‍රජා පාලන ප්‍රතිපත්තිය සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම.

මෙම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට රු. **10,706,478/-** ක් ලැබී තිබේ. මෙහිදී ඉලක්කගත ප්‍රදේශ නම් බදුල්ල හා මොනරාගල යන ඌව පළාත් දිස්ත්‍රික්ක ආවරණය වන සේ උතුරු, මධ්‍යම සහ ඌව පළාත් වේ.

### 4.2.3. උපදේශක සේවා : අ.) කාන්තාවන් සවිබලගැන්වීමේ වැඩසටහන



නව මැතිවරණ ක්‍රමය යටතේ නාමයෝජනා ඉදිරිපත් කිරීම, කොට්ඨාස පදනමින් නියෝජිතයින් තෝරාගැනීම සහ පොදු ලැයිස්තුවෙන් නියෝජිතයින් තෝරාගැනීම මෙන්ම 2017 අංක 16 දරන පනත යටතේ කාන්තා නියෝජනය සම්බන්ධයෙන් තීරණය කිරීමට යොදවා ඇති අනිවාර්ය ක්‍රමවේදය පිළිබඳව දැනගතයුතු කරුණු හා තොරතුරු රටේ සෑම ප්‍රදේශයකම ජනතාවගේ දැනුවත්භාවය උදෙසා සමාජය දැනුවත්කිරීමේ වැඩසටහනක් දියත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී තිබේ.



මෙම ක්ෂේත්‍රයට සම්බන්ධව කටයුතු කරන මහකොමසාරිස් කාර්යාල, තානාපති කාර්යාල සහ ජාත්‍යන්තර හා රාජ්‍ය නොවන සංවිධාන සමගින් පැවති සාකච්ඡාවන්හි දී දේශපාලනයට කාන්තා සහභාගීත්වය දිරිගැන්වීම උදෙසා යොමුවී සිදුකරන සාමූහික වැඩසටහනක් සඳහා ස්වකීය පූර්ණ සහයෝගය ලබාදීමට ඔවුන් එකඟ වී තිබේ.

මෙහි ප්‍රධාන අරමුණු නම්:

අ.) එළඹෙන පළාත්පාලන මැතිවරණයේදී අපේක්ෂිත කාන්තා නියෝජනය සාක්ෂාත් කරගැනීම සඳහා විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය හරහා සමාජය දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කිරීම

ආ.) පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් සමාජය දැනුවත් කිරීමේ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම

අපේක්ෂිත ප්‍රතිඵල නම්:

අ.) ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් හා ඊට සංවේදී දේශපාලන සංස්කෘතිය

ආ.) දේශපාලනයට කාන්තාවන් ඇතුළත් කරගැනීම හා ඔවුනට එහි නායකත්වය ලබාදීම පිළිගැනීමට ලක්වීම

ඇ.) පළාත්පාලන ආයතනවල සහ පාලනයේ සිටින කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉහළ යාම

ඈ.) පළාත් හා පාර්ලිමේන්තු දේශපාලනයට පයතැබීම සඳහා කාන්තාවන්ට එය වේදිකාවක් වීම

ඉ.) දේශපාලන පක්ෂ තුළ ස්ත්‍රීපුරුෂ සමාජභාවයට සංවේදී වූත් ප්‍රජාතන්ත්‍රවාදී වූත් දේශපාලන සංස්කෘතියක් ඇතිවීම

එහිදී කාන්තා නියෝජිතයින් අතරේ බෙදාහැරීම සඳහා පත්‍රිකා හා ලේඛන මුද්‍රණ කිරීමට USAID – SDGAP විසින් රු. **20,000,000/-**ක මුදලක් පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය වෙත ප්‍රදානය කරන ලදී.

ආ. <u>උතුරු නැගෙනහිර ප්‍රාදේශීය සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (**NELSIP**)</u>

පළාත්සභා සහ පළාත්පාලන අමාත්‍යාංශය යටතෙ ක්‍රියාත්මක වන මෙම උතුරු නැගෙනහිර ප්‍රාදේශීය සේවාවන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අංග කිහිපයක්ම වේ. පළාත්පාලන ආයතනවල ශක්‍යතාව වර්ධනය කිරීම ඒ අතරින් එකක් වේ.

ගරු පළාත්සභා සහ පළාත්පාලන අමාත්‍යවරයාගේ උපදෙස් ප්‍රකාරව, NELSIP හි එකී ශක්‍යතා වර්ධන කටයුතුවලට අදාළ විෂයයන් සඳහා උචිත පරිදි යම් යම් පුහුණු වැඩසටහන් පැවැත්වීම පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට පවරා තිබේ. පළාත්පාලන ක්ෂේත්‍රයේ අවශ්‍යතා සඳහා සේවා සැපයුම පිණිස එම ආයතනවල ශක්‍යතාවය වර්ධනයට මෙමගින් මග පාදයි. මේ සඳහා පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයට පවරන ලද පළාත් නම් ඌව, උතුරුමැද, වයඹ යන පළාත් වන අතර ඒ සඳහා රු. **7,153,600/-**ක අරමුදලක් ලබා දෙන ලදී.

අවශ්‍ය උපකරණවලින් සැදුම්ලත් විද්‍යාගාර, අන්තර්ජාලය හරහා පවත්වන පාඨමාලා සඳහා ප්‍රවේශය වැනි තොරතුරු තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් ආයතනයේ තත්වය වැඩිදියුණු කිරීම සඳහා අගනා අවස්ථා මෙම පැවරුම තුළින් උදා වේ.

තවද, මෙම පැවරුම යටතේ ඩිප්ලෝමා පාඨමාලා දෙකක් (සිංහල සහ දෙමළ) සහ නව සහතිකපත්‍ර පාඨමාලා දෙකක් ඇතුළත් වේ. NELSIP යටතේ තෝරාගත්, දුර්වල මට්ටමේ පැවති පළාත්පාලන ආයතන සඳහා විශේෂයෙන් නිර්මාණය කළ එම ඩිප්ලෝමා පාඨමාලා නොමිලයේ පවත්වන ලදී.

05 පරිච්ඡේදය - 2017 වර්ෂයේ මූල්‍ය තොරතුරු

## 5.1. විගණන මතය

429

12

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඩබ්ලිව්එන්පී2/සීබී/එච්/එස්එල්<br>අයිඑල්ජී/එෆ්ඒ /2017 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2018 සැප්තැම්බර් 11 දින |

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය ලැබුණා 17 SEP 2018 ලිපිය ............ ගොනුම් අංකය

සභාපති,
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය.

**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)සී වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ජූලි 20 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු. 508,434,195 ක් වූ රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද සටහන් 1 යටතේ වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මඟින් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් මාරු කරනු ලබන ප්‍රමාණාත්මක වටිනාකමක් රහිත වටිනාකම් ගිණුම්ගත නොකිරීමට තීරණය කර තිබුණු නමුත් ප්‍රමාණාත්මක සීමාව හඳුනාගෙන නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිගණක සහ උපාංග වලට අදාළ පෙර වර්ෂයේ සිදුකර තිබූ රු. 75,347 ක ඌන ක්ෂය ගණනය නිවැරදි කිරීම සඳහා පෙර වර්ෂයේ ලාභයට ගැළපිය යුතු වුවත් ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට ගැළපීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතන හා සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) මඟින් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ රු. 839,000 ක් වූ පරිගණක 10ක වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) පෞද්ගලික ආයතනයකින් මිලදී ගැනීමට තීරණය කර තිබූ රු. 412,500 ක් වටිනා අතේ ගෙන යා හැකි ක්ෂුද්‍ර පරිගණක (laptop) 03ක් මිලදීගෙන නොතිබියදී එම වත්කම් ගිණුම් ගත කිරීම හේතුවෙන් එම වටිනාකමෙන් පරිගණක උපාංග ගිණුම හා විවිධ ණයහිමි ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතන හා සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් ලද රු. 987,178 ක් වූ පරිගණක 10 සහ සර්වර් (Server) එකෙහි වටිනාකම ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කිරීම වෙනුවට ආදායම් ප්‍රකාශනයට බැර කර තිබුණි. එසේම මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීමේදී එම වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම්වල ජංගම නොවන වත්කම් මිලදී ගැනීම් ලෙස දක්වා තිබුණි .

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2015 වර්ෂයේදී මුද්‍රණය කරන ලද දිනපොත් වෙනුවෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 492,000 ක මුදල 2017 වර්ෂය තුළදී ලැබී නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට සේවක ණය ගිණුමෙහි දීර්ඝකාලීනව පැවති රු. 54,240 ක අසාමාන්‍ය බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ වෙළඳ ණය ගැතියන් සඳහා වූ ඇමුණුම අනුව ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙන් අයවිය යුතු මුදලක් ලෙස පෙර වර්ෂවල සිට පැවත එන රු. 31,219 ක් තිබූ අතර, ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් 2017 සැප්තැම්බර් 18 දිනැති ලිපිය පරිදි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් රු. 61,430 ක මුදලක් ගෙවිය යුතු බව දන්වා තිබුණි. එසේ වුවද මේ පිළිබඳව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් නොකළ අතර ණය හිමියන් වශයෙන් ද ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 හා 757(2) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | ආයතනය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ඡේදය | විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී වටිනාකම රු. 3,110,500 ක් වූ පර්යේෂණ අධ්‍යයන කොන්ත්‍රාත් 3 ක් සඳහා පුද්ගලයින් තිදෙනෙකු තෝරාගෙන තිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | වාහනවල ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) 1994 මාර්තු 08 දිනැති අංක 26/92 (1) දරන චක්‍රලේඛය | රාජකාරි කටයුතු සඳහා භාවිතා කරන රථවල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම ප්‍රදර්ශනය කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 5,411,945 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 4,805,575 ඌනතාවයක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,217,520 කින් වර්ධනය වී තිබුණි. විශේෂ ව්‍යාපෘති ආදායම රු. 9,524,436 කින් වැඩිවීම හා පරිපාලන වියදම රු. 735,384 කින් අඩුවීම ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු. 8,575,023 ක්ව පැවති ආයතනයේ ඌනතාවය 2017 වර්ෂය වන විට රු. 5,411,945 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු. 16,721,542 ක්වූ ආයතනයේ දායකත්වය උච්චාවචනය වෙමින් 2017 වර්ෂය අවසන් වන විට රු. 37,685,852 ක් වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

ආයතනය විසින් 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණද, එය 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 04 වන වගන්තියේ සඳහන් තොරතුරු ඇතුළත් කර පිළියෙල කර නොතිබුණි. එසේම, විගණනයට ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුකර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපීව පරීක්ෂා කළ හැකි ක්‍රමවේදයක් ආයතනය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ පුහුණු වැඩසටහන් 22 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් වංචාවක් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයකට යටත් කර ඇති අතිරේක අධ්‍යක්ෂවරිය සහ උපදේශක ඉංජිනේරු යන ආයතනයේ විධායක නිලධාරීන් දෙදෙනා 2016 ජනවාරි සිට රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබූ නමුත් මෙම නිලධාරීන් දෙදෙනා සඳහා 2017 වර්ෂය වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු. 1,534,320 ක මුදලක් ගෙවා තිබුණි. ආයතනයේ මුළු සේවක පාරිශ්‍රමික වියදම වූ රු. 11,597,372 ක මුදලින් මෙම නිලධාරීන් සඳහා වූ දායකත්වය සියයට 16 ක් වුවත් රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කළ දින සිට මෙම නිලධාරීන්ගෙන් ආයතනයේ කාර්යසාධනය සඳහා කිසිදු දායකත්වයක් ලබා ගෙන නොතිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශයට අනුයුක්ත කළ වූදිත නිලධාරීන්ගේ ප්‍රවාහන දීමනා හා දුරකථන දීමනා ගෙවීම ආයතනය විසින් නතර කිරීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SCFR 233/2017 දරන නඩුව ගොනු කර තිබූ අතර ආයතනය විසින් මේ සඳහා පෙනී සිටීමට නිතීඥ ගාස්තු ලෙස මේ වන විට රු. 375.000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී සිදු වූ මුදල් වංචාවක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2012 වර්ෂයේදී සිදු වූ මුදල් වංචාවක් සම්බන්ධයෙන් සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණය මත 2017 ජූලි 21 දින පාලක සභාව අදාල රියදුරුගේ සේවය අත්හිටුවීමටත්, වූදිත රියදුරුගෙන් රජයට අයවිය යුතු මුදල් අයකර ගැනීමටත් තීරණය කර තිබුණි.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කොටසේ XLVII පරිච්ඡේදයේ 23.9 වගන්තිය අනුව වැරදිකරු වූ නිලධාරියෙකුට දඬුවම් කළ යුතු දිනය වරද කළ දිනය ලෙස දක්වා තිබුණ ද ඒ අනුව කටයුතු නොකර සේවය අත්හිටුවීමට තීරණය ගැනීමට පාලක සභාව රැස් වූ 2017 ජූලි 21 දින සිට දඬුවම් නියම කිරීම හේතුවෙන් සේවය අත්හිටුවා තිබූ කාලය වෙනුවෙන් රු. 539,128 ක වැටුප් ගෙවා තිබුණි.

(iii) තවද 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතේ 13 වන වගන්තිය අනුව සේවා පාරිතෝෂිත ගෙවීම් පනතේ 13 වගන්තිය අනුව කම්කරුවෙකු විසින් සේවායෝජකයෙකුට කරන ලද අලාභ හෝ පාඩුවේ ප්‍රමාණයට පාරිතෝෂිත අහිමි කළ යුතු වුවත් එසේ කටයුතු නොකිරීම හේතුවෙන් රු. 187,596 ක් ගෙවා තිබුණි.

ඒ අනුව ගෙවන ලද එකතුව රු. 726,724 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දේශන සඳහා බඳවා ගනු ලබන බාහිර සම්පත් දායකයින් සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඉ) කෙටි කාලීන පුහුණු වැඩසටහනක් තුළ අන්තර්ගත විෂයයන් සම්බන්ධයෙන් පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඊ) විධිමත් විනය පරීක්ෂණයකදී වරදකරු වීම හේතුවෙන් පාලක සභාව විසින් සේවයෙන් පහකිරීමට නියමකර තිබූ දෙදෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට පාරිතෝෂික සඳහා රු. 51,391 ක් වෙන්කර තිබුණි.

(උ) සේවයෙන් පහ කළ හා වැඩ තහනමට ලක් වීමෙන් පසු මියගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 623,297 ණය ශේෂ පොත්වලින් ලියා හැරීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරීන් 16 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 92,016 ක ණය ශේෂ දීර්ඝ කාලයක සිට අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඌ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇති අවසන් තොගයේ වටිනාකම වූ රු. 1,686,163 තුළ පෙර වර්ෂවල සිට පැවත එන රු. 1,517,202 ක් වූ භාවිතයට ගත නොහැකි ප්‍රකාශන පොත්වලින් ඉවත් කිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි .

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-------------------------

සමාලෝචිත වර්ෂය තුලදී රේඛීය අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ පුනරාවර්ථන ප්‍රතිපාදන රු. 35,000,000 ක් හා පුහුණු කිරීමේ වියදම් සඳහා වූ මූලධන ප්‍රතිපාදන රු. 57,250,000 න් රු. 30,200,000 ක් හෙවත් සියයට 53 ක් උපයෝජනය කර නොතිබුණි. රේඛීය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා විගණනයට ඉදිරිපත් කළ විසර්ජන ගිණුමේ ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු ලෙස උපදේශකවරුන්ගේ හා වැඩසටහන් නිලධාරීන්ගේ පුරප්පාඩු හා පළාත් පාලන ආයතනවල නවක මන්ත්‍රීන් පත්වීම ප්‍රමාද වීම දක්වා තිබුණි. විගණනය සඳහා ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව පළාත් පාලන ආයතනවල සභිකයන් පුහුණු කිරීමේ වැඩසටහන් කිසිවක් හඳුනාගෙන නොතිබූ අතර උපදේශකවරුන්ගේ හිඟය මඟහරවා ගැනීම සඳහා බාහිර සම්පත් දායකයින් යොදාගත හැකිව තිබුණි.

### 4.4 විධිමත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

ආයතනය සඳහා ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස තනතුරක් නොතිබියදී අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස ද මාසයකට රු. 60,000 බැගින් පසුගිය වර්ෂයේදී මාස 8 ක් සඳහා රු. 480,000 ක් ලබාගෙන තිබුණි. එයින් රු. 100,000 ක මුදලක් 2017 මාර්තු 22 දින ආපසු ගෙවා තිබුණි.

### 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

ආයතනයේ කාර්ය මණ්ඩලයට ණය ලබාදීම සඳහා චක්‍රීය අරමුදලක් ලෙස ක්‍රියාත්මක විය යුතු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුමේ 2017 ජනවාරි 01 දිනට ශේෂය රු. 4,399,788 ක් වූ අතර මෙම මුදල ආයෝජනයකට හෝ ස්ථාවර තැන්පතුවකට මාරු නොකිරීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි.

### 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

---

2017 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 49 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 36 ක් විය. 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 3 වගන්තිය ප්‍රකාරව ආයතනයට පැවරී ඇති කර්තව්‍යයන් පදනම් කරගනිමින් ආයතනය සඳහා ගැලපෙන ආකාරයට කාර්යමණ්ඩලය අනුමත කරවා ගැනීමට සහ දීර්ඝ කාලීනව පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

---

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

---

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර " 2030 න්‍යාය පත්‍රය " ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළගාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය

---------------------

ආයතනය විසින් අභ්‍යන්තර විගණකවරයෙකු පමණක් සේවයේ යොදවා තිබුණ අතර වෙනත් කිසිදු නිලධාරියෙකු අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර නොතිබුණ බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

### 6.2 අයවැය ලේඛනය පාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වන වගන්තිය අනුව රජයේ සෑම නීතිගත සංස්ථාවක් විසින්ම අදාළ මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03කට නොවැඩි කාලයකට පෙර අයවැය ලේඛනයක් පිළියෙල කර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. එම අයවැය ලේඛනයෙහි අදාළ මුදල් වර්ෂය සඳහා අයවැයගත ලාභාලාභ ගිණුමක්, ශේෂ පත්‍රයක් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පෙන්නුම් කළයුතු බවට පනතේ 8(3) වගන්තියේ දක්වා ඇතත් එකී විධිවිධාන ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

(ආ) 1999 අංක 31 දරන පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 03 වගන්තිය අනුව පළාත් සභා සහ පළාත් පාලනය ආයතනවල සභිකයින්, නිලධරයන් හා සේවකයන් පුහුණු කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ උපදේශන සේවා සැපයීම ආයතනයේ ප්‍රධාන කර්තව්‍යයන් වේ. ඒ අනුව ආයතනයේ මෙහෙයුම් වියදම් ඇස්තමේන්තු කිරීමේදී ආයතනයේ ප්‍රධාන මෙහෙයුම වන පුහුණු කිරීම ඇතුලත්ව පර්යේෂණ සහ උපදේශන සේවා ද සැළකිල්ලට ගෙන ඇස්තමේන්තු කිරීම වෙනුවට ප්‍රාග්ධන වියදම් යටතේ මානව සම්පත් සංවර්ධනය සඳහා රු. 57,250,000 ක් ඇස්තමේන්තු කර තිබුණි.

### 6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-------------------------------

2016 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව සභාගත කර නොතිබුණි.

## 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා මහල් 4 කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2013 වර්ෂයේ දී ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන රු. 53,196,907 ක කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණු අතර ගොඩනැගිල්ලේ පයිල් අත්තිවාරම ඉදිකිරීම ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) යෝජිත මහල් 04 කින් ගොඩනැගිල්ල මහල් 8 ක් දක්වා වැඩිකිරීමට 2013 නොවැම්බර් 04 දින ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කර ප්‍රධාන කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දැනුම් දී තිබුණ ද ඒ සම්බන්ධව ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් උපකොන්ත්‍රාත්කරු දැනුවත් නොකිරීම හේතුවෙන් මහල් 4 කට පමණක් ප්‍රමාණවත් පරිදි පයිල් අත්තිවාරම ඉදිකර තිබුණි.

(ii) පයිල් අත්තිවාරම් ඉදිකිරීම අධීක්ෂණය කිරීම සඳහා ආයතනය විසින් උපදේශාත්මක සමාගමක් හෝ පුද්ගලයෙකු පත්කර නොතිබුණි. උපකොන්ත්‍රාත්කරුගේ වැඩ අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් අධීක්ෂණ වියදම් ලෙස රු. 755,709 ක් බිල්කර තිබුණ ද ඉදිකර තිබුණු පයිල් සඳහා සිදුකළ යුතු තාක්ෂණික පරීක්ෂණ කිසිවක් සිදුකර නොතිබුණු අතර උපකොන්ත්‍රාත්කරු විසින් ද එම පරීක්ෂණ සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) ඉදිකර තිබුණු පයිල්, පරීක්ෂා කිරීමකින් තොරව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු වෙත රු. 38,147,381 ක් ගෙවා තිබුණු අතර පයිල් යා කර කොන්ක්‍රීට් තට්ටු (Pile Cap) යොදා තිබීම නිසා ඒවා පසුව පරීක්ෂා කිරීමට නොහැකි තත්ත්වයක පැවතුණි.

(iv) පයිල් තට්ටු (Pile Cap) යොදා නොතිබුණු පයිල් 02 ක් සඳහා පමණක් ආයතනය විසින් පසුව PDA පරීක්ෂණය සිදුකර තිබුණි. ඒ අතරින් එක් පයිල් එකක් අවශ්‍ය ගුණාත්මකභාවය නොමැති බව තහවුරු කරගෙන තිබුණු අතර ඉතිරි පයිල් සියල්ලෙහිම ගුණාත්මකභාවය පිළිබඳ තහවුරු කර නොතිබුණි. ඒ අනුව ඒවා මත ගොඩනැගිල්ල ඉදිකිරීම සුදුසු නොවන බව ආයතනය විසින් පිළිගෙන ඇති බැවින් මේ සඳහා දරන ලද රු. 44,757,072 ක වියදම නිෂ්කාර්ය වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

**6.5 සමාජ වගකීම් ඉටුකිරීම**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයට අදාළ පාරිසරික හා සමාජ වගකීම් හඳුනාගෙන නොතිබුණි.

(ආ) අපද්‍රව්‍ය කළමනාකරණය පළාත් පාලන ආයතනවල ප්‍රධාන කර්තව්‍යයක් වුවද ඊට අදාළ කිසිදු පුහුණු වැඩසටහනක් හෝ වැඩමුළුවක් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
| --- | --- |
| ස්ථාවර වත්කම් පාලනය. | ස්ථාවර වත්කම් ලේඛනයක් නිසි පරිදි පවත්වා නොගැනීම. |
| ගිණුම්කරණය. | ක්ෂය සඳහා වෙන්කිරීම් කිරීමේදී දුර්වලතාවයන් පැවතීම. |
| කාර්ය මණ්ඩල පරිපාලනය. | පුද්ගලික ලිපි ගොනු නිසි පරිදි පවත්වාගෙන නොයාම, වැටුප් වර්ධක ලබා නොදීම, විනය සම්බන්ධ කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හා ආයතනයට ගැලපෙන ආකාරයට බඳවා ගැනීමේ පටිපාටි සංශෝධනය නොකිරීම. |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම. | ආයතනයේ වර්තමාන කාර්ය මණ්ඩලයෙන් උපරිම දායකත්වය ලබා නොගැනීම හා අනුමත දීමනා යටතේ බාහිර සම්පත් දායකයින් යොදාගෙන පුහුණු වැඩසටහන් පැවැත්වීමේ දුර්වලතාවයන් පැවතීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

***පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය***

**පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය**

# 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ

***අංක 17, මලලසේකර මාවත,  කොළඹ 07***
***දුරකථන : 0112570307  ෆැක්ස් :  0112570316***
***ඊමේල්: info@slilg.gov.lk***
***වෙබ් අඩවිය: www.slilg.lk***

**පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනය**
**2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| | සටහන් | 31/12/2017 | 31/12/2016 |
|---|---|---|---|
| මෙහෙයුම් ආදායම | | | |
| රජයේ දායකත්වය | 01 | 60,354,000.00 | 52,429,000.00 |
| ගාස්තු අයකරන පාඨමාලාවලින් ආදායම | 02 | 3,993,750.00 | 4,936,250.00 |
| විශේෂ ව්‍යාපෘතිවලින් ආදායම | 03 | 19,009,401.52 | 9,484,964.62 |
| වෙනත් ආදායම් | 04 | 4,133,604.24 | 688,388.13 |
| මුළු මෙහෙයුම් ආදායම | | **87,490,755.76** | **67,538,602.75** |
| මෙහෙයුම් වියදම් | | | |
| පරිපාලන සහ ආයතනික වියදම් | 05 | 34,847,269.77 | 35,582,653.61 |
| මානව සම්පත් සංවර්ධන වියදම් | 06 | 24,463,515.96 | 15,715,873.84 |
| ගාස්තු අයකරන පාඨමාලා සඳහා දැරූ වියදම් | 07 | 3,253,677.93 | 4,340,695.21 |
| විශේෂ ව්‍යාපෘති සඳහා දැරූ වියදම් | 08 | 8,862,533.93 | 8,847,374.93 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සහ ක්ෂයවීම් | 09 | 10,651,812.74 | 7,857,580.47 |
| මුළු මෙහෙයුම් වියදම් | | **82,078,810.33** | **72,344,178.06** |
| වර්ෂය සඳහා වන අතිරික්තය / හිඟය | | **5,411,945.43** | **(4,805,575.31)** |

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

**2017** දෙසැම්බර් **31** දින වන විට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | Notes | 31/12/2017 | 31/12/2016 |
|---|---|---|---|
| *වත්කම්* | | | |
| *ජංගම නොවන වත්කම්* | | | |
| *දේපල, පිරියත සහ උපකරණ* | *10* | *421,532,310.47* | *425,160,205.37* |
| | | ***421,532,310.47*** | ***425,160,205.37*** |
| *කාරක ප්‍රාග්ධනය* | | | |
| *නව ගොඩනැගිල්ල ඉදි කිරීම* | *11* | ***45,357,072.25*** | ***44,757,072.25*** |
| *ජංගම වත්කම්* | | | |
| *තොග* | *12* | *1,686,162.94* | *1,801,487.25* |
| *පෙරගෙවුම් සහ ලැබිය යුතු* | *13* | *4,425,363.37* | *3,292,169.33* |
| *ණයගැතියෝ සහ අත්තිකාරම්* | *14* | *9,873,301.13* | *11,535,778.80* |
| *මුදල් හා මුදල් සමාන දෑ* | *15* | *31,476,595.26* | *11,933,776.88* |
| | | ***47,461,422.70*** | ***28,563,212.26*** |
| *මුළු වත්කම්* | | ***514,350,805.42*** | ***498,480,489.88*** |
| සම කොටස් සහ වගකීම් | | | |
| *රජයේ දායකත්වය - ප්‍රාග්ධන* | | *508,434,195.41* | *508,434,195.41* |
| *සමුච්චිත අරමුදල්* | | *(15,355,001.88)* | *(21,606,447.31)* |
| *UNDP ප්‍රදාන* | | *714,658.79* | *714,658.79* |
| *ව්‍යාපෘති දායකත්වය - ප්‍රාග්ධනය* | | *1,595,824.75* | *1,595,824.75* |
| *ආසියා පදනමෙන් ලැබූ ප්‍රදානය* | | *291,000.00* | *291,000.00* |
| | | ***495,680,677.07*** | ***489,429,231.64*** |
| *ජංගම නොවන වගකීම්* | | | |
| *විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්* | *16* | *6,724,417.50* | *5,224,933.23* |
| *රඳවාගත් මුදල්* | | *1,512,000.00* | *1,512,000.00* |
| | | ***8,236,417.50*** | ***6,736,933.23*** |
| *ජංගම වගකීම්* | | | |
| *ප්‍රතිපාදන - විගණන ගාස්තු* | | *662,400.00* | *350,000.00* |
| *ණයකරුවෝ සහ උපචිත ගාස්තු* | *17* | *9,771,310.85* | *1,964,325.01* |
| | | ***10,433,710.85*** | ***2,314,325.01*** |
| *මුළු වත්කම් හා වගකීම්* | | ***514,350,805.42*** | ***498,480,488.88*** |

05 වැනි පිටුවේ සිට 15 වැනි පිටුව දක්වා කොටසෙහි ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යාවශ්‍ය අංගයක් වේ. 2017.12.31 වැනි දින වන විට පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පැවති තත්වය පිළිබඳ සහ අවසන් වූ එම වසරේ අතිරික්තය/ (හිඟය) සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ මතයක් මෙම මූල්‍ය ප්‍රකාශ හරහා ලබාදෙන බවට අපි සහතික වෙමු.

.................................
සුජීව සමරවීර
අධ්‍යක්ෂ/ ප්‍ර.වි.නි.

.................................
පී.ඒ.ඩී. හිරාන් රදීෂ
සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) වැ.බ./
ගිණුම්කරණ නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශ සූදානම් කර ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වගකියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලදී.

.................................
එච්. ටී. කමල් පද්මසිරි
සභාපති - පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා
ආයතනය / පළාත්සභා සහ පළාත්පාලන
අමාත්‍යාංශ ලේකම්

.................................
එන්.එම්.එම්. නින්සීර්
පාලක සභා සහ AMCසාමාජික

**පළාත්පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය**

**2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | | **31/12/2017** |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| *සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ඇතිව තිබෙන අතිරික්තය / හිඟය* | | *5,411,945.43* |
| *මුදල් නොවෙන සංචලන සඳහා ගැලපුම්* | | |
| *ක්ෂයවීම්* | *8,544,523.97* | |
| *පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන* | *1,794,888.77* | |
| | | *10,339,412.74* |
| *කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය* | | ***15,751,358.17*** |
| වැඩිවූ/ අඩුවූ තොග/ ණයගැතියෝ/වෙනත් ලැබීම් | *644,607.94* | |
| වැඩිවූ/ අඩුවූ ණයහිමියෝ සහ ගෙවියයුතු | *8,119,385.84* | *8,780,315.04* |
| *මෙහෙයුම් තුලින් උත්පාදිත මුදල්* | | ***24,531,673.21*** |
| *ගෙවන ලද පාරිතෝෂික* | *(295,404.50)* | |
| | - | *(295,404.50)* |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල්** | | ***24,236,268.71*** |
| *ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ* | | |
| ජංගම නොවන වත්කම් මිලදී ගැනීම | | *(4,916,627.38)* |
| පොළී ආදායම | | *223,177.05* |
| *ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ* | | ***19,542,818.38*** |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ | | |
| ප්‍රාග්ධන දායකත්වයෙන් ලද පැවරුම් | | - |
| වර්ෂය තුළ ශුද්ධ සංචරණය | | ***19,542,818.38*** |
| *කාලපරිච්ඡේදය ආරම්භයේදී  මුදල් හා මුදල් සමාන දෑ* | | *11,933,776.88* |
| *කාලපරිච්ඡේදය අවසන් වන විට මුදල් හා මුදල් සමාන දෑ* | *'ඒ' සටහන* | ***31,476,595.26*** |

**'ඒ' සටහන**

| | |
|---|---|
| *බැංකුවේ ඇති මුදල් - ලංකා බැංකු ගිණුම් අංක* 2323344 | *11,136,545.27* |
| *බැංකුවේ ඇති මුදල් - ලංකා බැංකු ගිණුම් අංක* 2323350 | *13,754,856.25* |
| *ඉතුරුම් ගිණුම් - ලංකා බැංකු ගිණුම් අංක* 2329975 | *6,585,193.74* |
| | *31,476,595.26* |

පළාත් පාලන ආයතන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂයේදී

ශුද්ධ වත්කම් වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | රජයේ දායකත්වය -ප්‍රාග්ධනය | සමුච්චිත අරමුදල් | UNDP ප්‍රදාන | ව්‍යාපෘති දායකත්වය - ප්‍රාග්ධන | ආසියා පදනමෙන් ලද ප්‍රදාන | TOTAL |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2017.01.01 වන දිනට ශේෂය | 508,434,195.41 | (21,606,447.31) | 714,658.79 | 1,595,824.75 | 291,000.00 | 489,429,231.64 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | - | 5,411,945.43 | - | | - | 5,411,945.43 |
| කාලපරිච්ඡේදය තුළ සිදු කල පැවරුම් | - | - | - | - | - | - |
| පෙර වසර සඳහා ගැලපුම් ('ඒ' සටහන ) | - | 839,500.00 | - | - | - | 839,500.00 |
| කාලපරිච්ඡේදය සඳහා UNHABITAT ප්‍රදාන | - | - | - | - | - | - |
| 2017.12.31 වන දිනට ශේෂය | 508,434,195.41 | (15,355,001.88) | 714,658.79 | 1,595,824.75 | 291,000.00 | 495,680,677.07 |

'ඒ' සටහන

පෙර වර්ෂයේ ගැලපුම්වල සංචලන

| | සමුච්ජිත අරමුදල රු. |
|---|---|
| ඩීඑම්සී ව්‍යාපෘතියේ නොගෙවූ දීමනා සඳහා ගැලපුම් | 174,500.00 |
| විශේෂ ව්‍යාපෘති සඳහා ගෙවූ අත්තිකාරම් ගැලපුම | (415,000.00) |
| නොපියවූ විධාය අධ්‍යක්ෂ දීමනා සඳහා ගැලපුම | 380,000.00 |
| නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ පිරිවැය සඳහා ගැලපුම | 600,000.00 |
| ආපසු ගෙවන තැන්පතුව සඳහා ගැලපුම | 100,000.00 |
| | 839,500.00 |

පළාත් පාලන ආයතන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂයසඳහා වන

ගිණුම් සඳහා සටහන්

| | | 31/12/2017 | 31/12/2016 |
|---|---|---|---|
| **01 සටහන - රජයේ දායකත්වය** | | | |
| 2100 - 02 | මහා භාණ්ඩාගාරය - පුනරාවර්තන | 33,304,000.00 | 34,000,000 |
| | මහා භාණ්ඩාගාරය - ප්‍රාග්ධන | 27,050,000.00 | 18,429,000 |
| | එකතුව | **60,354,000.00** | **52,429,000** |
| **02 සටහන- ගාස්තු අයකරන පාඨමාලාවලින් ආදායම** | | | |
| ඩිප්ලෝමා පාඨමාලාවලින් ආදායම | | | |
| 2101-01-02-01 | ඉංජිනේරු ඩිප්ලෝමාව 2015/16 | 20,000.00 | 70,000.00 |
| 2101-01-07-01 | පළාත්පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2014/15 | - | 50,000.00 |
| 2101-01-07-02 | පළාත්පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2015/16 | 191,000.00 | 1,179,000.00 |
| 2101-01-07-03 | පළාත්පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2017/18 | 1,830,250.00 | 1,079,750.00 |
| 2101-01-07-04 | ප්‍රජා සංවර්ධන ඩිප්ලෝමාව 2017/18 | 1,235,000.00 | - |
| 2101-01-07-05 | ඉංජිනේරු ඩිප්ලෝමාව 2015/16 | 200,000.00 | - |
| | | 3,476,250.00 | 2,378,750.00 |
| සහතිකපත්‍ර පාඨමාලාවලින් ආදායම | | | |
| 2101-02-03-01 | කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව | - | 265,000.00 |
| 2101-02-03-02 | මානව සම්පත් කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව | 45,000.00 | 615,000.00 |
| 2101-02-03-03 | ව්‍යාපෘති කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව | - | 300,000.00 |
| 2101-02-03-04 | පුස්තකාල සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව | 82,500.00 | 472,500.00 |
| 2101-02-04-01 | ඔටෝකැඩ් සහතිකපත්‍ර පාඨමාලාව | 70,000.00 | 185,000.00 |
| 2101-02-09-01 | පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | - | 720,000.00 |
| 2101-02-09-02 | පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 320,000.00 | - |
| | | **517,500.00** | **2,557,500.00** |

| | | 31/12/2017 | 31/12/2016 |
|---|---|---|---|
| **03 සටහන - විශේෂ ව්‍යාපෘතිවලින් ලද ආදායම** | | | |
| 2101-04 | උතුරු නැගෙනහිර ප්‍රාදේශීය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) | 7,153,600.00 | 6,122,939.12 |
| 2101-05 | UNDP ධූත මණ්ඩල සංචාරය | - | 1,536,406.20 |
| 2101-06 | Chrysalis RtM ව්‍යාපෘතිය | 1,149,323.52 | 1,825,619.30 |
| 2101-07 | Chrysalis Space ව්‍යාපෘතිය | 10,706,478.00 | - |
| | එකතුව | **19,009,401.52** | **9,484,964.62** |
| **04 සටහන - වෙනත් ආදායම්** | | | |
| 1505 - 01 | විවිධ ආදායම් | 467,586.51 | 51,081.25 |
| 1505 - 02 | සේවකයින් ලබාගත් ණය සඳහා පොලී | 391,730.58 | 479,426.26 |
| 1505 - 03 | ප්‍රකාශන අලෙවිය | 23,005.00 | 31,927.00 |
| 1505 - 05 | ඉතුරුම් ගිණුම් සඳහා පොලී | 223,177.05 | 125,953.62 |
| 1505 - 05 | ජංගම නොවන වත්කම් අලෙවිය | 2,039,900.00 | - |
| 1505 - 06 | සේවකයින්ට ගෙවූ අත්තිකාරම් සඳහා පොලී | 1,027.60 | - |
| 1505 - 07 | දායකත්ව ආදායම් | 987,177.50 | - |
| | එකතුව | **4,133,604.24** | **688,388.13** |
| **05 සටහන - පරිපාලන සහ ආයතනික වියදම් :-** | | | |
| 1503 - 01 - 01 | පුද්ගල පඩිනඩි වැටුප් හා වේතන | 12,491,181.49 | 9,361,091.74 |
| 1503 - 01 - 02 | සේවක අර්ථසාධක අරමුදල | 2,119,544.53 | 2,220,682.66 |
| 1503 - 01 - 03 | සේවක භාරකාර අරමුදල | 529,886.16 | 555,170.98 |
| 1503 - 01 - 04 | නිවාඩු දින වැටුප් හා අතිකාල | 707,056.94 | 543,017.61 |
| 1503 - 01 - 05 | අනෙකුත් දීමනා ගමන් වියදම් | 7,163,442.71 | 1,244,886.86 |
| 1503-02-01 | ගමන් වියදම් - දේශීය | 468,716.51 | 490,180.51 |
| 1503-02-02 | ගමන් වියදම් - විදේශීය | 249,553.80 | 443,805.09 |
| | සැපයුම් | | |
| 1503 - 03 - 01 | ලිපි ද්‍රව්‍ය | 1,696,979.39 | 1,323,836.58 |
| 1503 - 03 - 02 | ඉන්ධන හා ලිහිසි | 1,319,362.92 | 1,331,816.77 |
| 1503 - 03 - 03 | නිල ඇඳුම් නඩත්තු වි යදම් | 24,000.00 | 28,000.00 |
| 1503 - 04 - 01 | වාහන | 2,121,891.83 | 1,776,705.53 |

| | | | |
|---|---|---|---|
| *1503 - 04 - 02* | *පිරියත, යන්ත්‍ර සහ උපකරණ* | *473,923.21* | *678,802.81* |
| *1503 - 04 - 03* | *ගොඩනැගිල්ල ගිවිසුම්ගත සේවා* | *980,068.27* | *1,214,067.94* |
| *1503-05- 01* | *වරිපනම් සහ බදුකුලී* | *97,999.20* | *97,999.20* |
| *1503-05- 02* | *දුරකථන* | *522,099.53* | *539,502.50* |
| *1503-05- 03* | *තැපැල් ගාස්තු* | *98,555.00* | *135,676.50* |
| *1503-05- 04* | *ජලය සහ විදුලිය* | *1,080,424.90* | *1,020,984.23* |
| *1503-05- 05* | | *47,250.00* | *45,715.00* |
| *1503-05- 06* | *ආරක්ෂක සේවා* | *1,308,350.00* | *1,293,531.92* |
| *1503-05- 08* | ප්‍රචාරණ වියදම් | *303,898.75* | *571,853.20* |
| *1503-05- 09* | සංග්‍රහ වියදම් | *295,291.82* | *235,268.80* |
| *1503-05- 10* | කාර්යාලීය වියදම් | *368,542.81* | *430,057.18* |
| *1503-05- 11* | මූලික අයිතිවාසිකම් නඩු සඳහා වියදම් | *375,000.00* | - |
| *1503-05- 12* | බැංකු ගාස්තු | *4,250.00* | - |
| | *එකතුව* | ***34,847,269.77*** | ***35,582,652.61*** |

| | | 31/12/2017 | 31/12/2016 |
|---|---|---|---|

***06 - සටහන - මානව සම්පත් සංවර්ධන වියදම්:-***

| | | | |
|---|---|---|---|
| 2201 - 05 - 01 | මානව සම්පත් සංවර්ධන වියදම් - ජාතික මට්ටමේ පුහුණු පාඨමාලා | | |
| 2201 - 05 - 01 - 02 | මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - ඉංජිනේරු අංශය | *2,779,566.34* | *1,897,279.40* |
| 2201 - 05 - 01 - 03 | මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - පොදු කළමනාකරණ අංශය | *2,191,242.39* | *1,332,132.37* |
| 2201 - 05 - 01 - 04 | මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු -භෞතික සැලසුම් අංශය | *1,850,416.46* | *1,494,040.77* |
| 2201 - 05 - 01 - 05 | මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු -මූල්‍ය කළමනාකරණ අංශය | *2,961,696.34* | *1,703,473.59* |
| 2201 - 05 - 01 - 06 | මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - නෛතික අංශය | *2,064,700.39* | *1,169,162.18* |
| 2201 - 05 - 01 - 07 | මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - ශාස්ත්‍රීය | *2,416,631.75* | *928,628.00* |
| 2202 - 05 - 01 - 08 | මා.ස.සං. වියදම් - ජාතික මට්ටමේ පුහුණු - තොරතුරු සන්නිවේදන තාක්ෂණය 2015, | *1,989,116.52* | *735,266.20* |
| | මා.ස.සං. සහ අනෙකුත් වියදම් | | *309,992.15* |
| 2201 - 05 - 03 | මා.ස.සං. වියදම් - පළාත් පාලනය පිලිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සහ අධ්‍යක්ෂ අංශයේ ශක්‍යතා වර්ධනය | *1,970,136.10* | *1,438,356.63* |
| 2201 - 05 - 04 | මා.ස.සං. වියදම් - පර්යේෂණ අංශය | *3,240,009.67* | *1,855,260.25* |
| | එකතුව | ***21,463,515.96*** | ***12,863,591.54*** |

| | | | |
|---|---|---|---|
| 2201 - 05 - 02 | මා.ස.සං. වියදම් - පළාත් මට්ටමේ පුහුණු වැඩසටහන් | | |
| 2201-05-02-02 | මා.ස.සං. වියදම් - පළාත් මට්ටමේ පුහුණු - ඉංජිනේරු අංශය | - | *214,144.00* |
| 2201-05-02-03 | මා.ස.සං. වියදම් - පළාත් මට්ටමේ පුහුණු - පොදු කළමනාකරණ අංශය | - | *473,718.50* |
| 2201-05-02-04 | මා.ස.සං. වියදම් - පළාත් මට්ටමේ පුහුණු -භෞතික සැලසුම් අංශය | - | *422,691.00* |
| 2201-05-02-05 | මා.ස.සං. වියදම් - පළාත් මට්ටමේ පුහුණු -මූල්‍ය කළමනාකරණ අංශය | - | *487,109.00* |
| 2201-05-02-06 | මා.ස.සං. වියදම් - පළාත් මට්ටමේ පුහුණු - නෛතික අංශය | - | *398,070.00* |
| 2201-05-02-07 | මා.ස.සං. වියදම් - පළාත් මට්ටමේ පුහුණු - ශාස්ත්‍රීය | *3,000,000.00* | *571,322.80* |
| 2201-05-02-09 | මා.ස.සං. වියදම් - පළාත් මට්ටමේ පුහුණු - පර්යේෂණ අංශය | - | *285,227.00* |
| | එකතුව | ***3,000,000.00*** | ***2,852,282.30*** |

**07 - සටහන- ගාස්තු අයකරන පාඨමාලා සඳහා වියදම**

| | | | |
|---|---|---|---|
| *2201-06-01-02-01* | ඉංජිනේරු ඩිප්ලෝමාව 2015/16 *වියදම* | *144,914.00* | *608,995.00* |
| *2201-06-01-07-01* | පළාත්පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2014/15 *වියදම* | - | *550,340.72* |
| *2201-06-01-07-02* | පළාත්පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව 2015/16 *වියදම* | *651,570.86* | *1,389,649.50* |
| *2201-06-01-07-03* | පළාත්පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව *2016/17 වියදම* | *928,918.33* | *214,358.90* |
| *2201-06-01-07-04* | පළාත්පාලනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව *2017/18 වියදම* | *176,098.00* | - |
| *2201-06-01-07-05* | ප්‍රජා සංවර්ධන ඩිප්ලෝමාව *2017/18* | *75,765.00* | - |
| | *එකතුව* | ***1,977,266.19*** | ***2,763,344.12*** |

| | | | |
|---|---|---|---|
| *2201-06-02-03-02* | මානව සම්පත් කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව 2016 *වියදම* | *8,200.00* | *354,401.00* |
| *2201-06-02-03-03* | ව්‍යාපෘති කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාව 2016 *වියදම* | *32,453.00* | *189,400.25* |
| *2201-06-02-03-04* | පුස්තකාල සංවර්ධන සහතිකපත්‍ර පාඨමාලාව 2016 *වියදම* | *157,169.76* | *69,557.00* |
| *2201-06-02-04-01* | ඔටෝකැඩ් සහතිකපත්‍ර පාඨමාලාව 2016 *වියදම* | *247,586.20* | *199,018.00* |
| *2201-06-02-08-01* | *පරිගණක යෙදවුම්* සහතිකපත්‍ර පාඨමාලාව 2015 *වියදම* | - | *255,231.39* |
| *2201-06-02-09-01* | පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව 2016 *වියදම* | - | *509,743.45* |
| *2201-06-02-09-02* | පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව 2017 *වියදම* | *182,333.00* | - |
| *2201-06-02-09-03* | *සහතිකපත් ප්‍රදානෝත්සවයේ වියදම් - 2017* | *648,669.78* | - |
| | *එකතුව* | ***1,276,411.74*** | ***1,577,351.09*** |

| | | 31/12/2017 | 31/12/2016 |
|---|---|---|---|
| **08 සටහන - විශේෂ ව්‍යාපෘති සඳහා වියදම් :-** | | | |
| 1504-01 | ඩී එම් සී ව්‍යාපෘතියේ වියදම් | - | 277,487.00 |
| 1504-02 | උතුරු නැගෙනහිර ප්‍රාදේශීය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ වියදම් (Nelsip) | 5,111,075.16 | 6,249,062.56 |
| 1504-03 | UNDP ධූත මණ්ඩල සංචාරය- වියදම් | - | 995,618.57 |
| 1504-04 | Chrysalis RtM ව්‍යාපෘතියේ වියදම් | 581,823.52 | 1,325,206.80 |
| 1504-05 | Chrysalis Space ව්‍යාපෘතියේ වියදම් | 2,965,818.25 | - |
| 1504-06 | UNHABITAT SLC ව්‍යාපෘතියේ වියදම් | 203,817.00 | - |
| | එකතුව | **8,862,533.93** | **8,847,374.93** |

| | | | |
|---|---|---|---|
| **09 සටහන - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සහ ක්ෂයවීම්** | | | |
| 2102 - 03 | පාරිතෝෂික | 1,794,888.77 | (1,351,949.53) |
| 2102 - 04 | විගණන ගාස්තු | 312,400.00 | - |
| 2105 - 02 | ක්ෂයවීම් | 8,544,523.97 | 9,209,530 |
| | එකතුව | **10,651,812.74** | **7,857,580.47** |

පළාත් පාලන ආයතන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂයසඳහා වන

ගිණුම් සඳහා සටහන්

**10 - සටහන - දේපල පිරියත සහ උපකරණ :-**

| | | 2017/01/01 වන දිනට පිරිවැය | එකතු කිරීම 2017 | ඉවත් කිරීම් 2017 | 2017/12/31 වන දිනට එකතුව | 2017/01/01 දිනට ක්ෂයවීම් | ඉවත් කිරීම් 2017 | ක්ෂයවීම් 2017 | 2017/12/31 වන දිනට සමුච්චිත ක්ෂයවීම් | 2017/12/31 දිනට අගය හින වූ වටිනාකම | 2016/12/31 දිනට අගය හින වූ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2201-01 | ඉඩම් | 406,890,000.00 | - | - | 406,890,000.00 | - | - | - | - | 406,890,000.00 | 406,890,000.00 |
| 2201-02 | ගොඩනැගිලි | 15,659,000.00 | - | - | 15,659,000.00 | 10,178,350.00 | - | 782,950.00 | 10,961,300.00 | 4,697,700.00 | 5,480,650.00 |
